සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

ව්‍යාපාර අධ්‍යයනය I
வணிகக் கல்வி I
Business Studies I

32 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**
- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- ※ **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.
- ※ ප්‍රශ්න අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ※ ප්‍රශ්න අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- ※ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

විභාග අංකය : ...................................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංක | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති. ප්‍රධාන පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |

**1.** පාරිභෝගිකයකු විසින් තම අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීම සඳහා භාණ්ඩ හා සේවා මිල දී ගැනීමේ දී මූලික වශයෙන් සලකා බලනු ලබන සාධක වන්නේ,
(1) වියදම හා ඇසුරුමයි. (2) ඇසුරුම හා ගුණත්වයයි.
(3) තෘප්තිය හා වෙළෙඳ නාමයයි. (4) වියදම හා වෙළෙඳ නාමයයි.
(5) වියදම හා තෘප්තියයි. (......)

**2.** පහත සඳහන් දෑ අතුරෙන් ආරම්භයේ සිට ම ජාත්‍යන්තර වෙළෙඳපොළ මූලික කරගත් (Born Global) ව්‍යාපාරයක් වන්නේ,
(1) මෝටර් රථ (Motor vehicles) ය. (2) විදුලි උපකරණ (Electrical equipment) ය.
(3) ඇඟලුම් (Apparel) ය. (4) ඉදිකිරීම් (Constructions) ය.
(5) සමාජ ජාලා අඩවි (Social network sites) ය. (......)

**3.** නව ව්‍යාපාර ප්‍රවණතාවක් **නො වන්නේ** පහත සඳහන් දෑ අතුරෙන් කුමක් ද?
(1) ගෝලීයකරණය (2) විද්‍යුත් ගනුදෙනු
(3) මහා පරිමාණ නිෂ්පාදන (4) හරිත නිෂ්පාදන
(5) ව්‍යාපාර කටයුතු බාහිර ආයතන මගින් කරවා ගැනීම (Business outsourcing) (......)

**4.** පහත වගුවේ **X** තීරුව මගින් ව්‍යාපාර වර්ගීකරණ පදනම් කිහිපයක් ද, **Y** තීරුව මගින් එම පදනම් සඳහා නිදසුන් කිහිපයක් ද දැක්වේ.

| X | Y |
|---|---|
| A. අයිතිය | 1. මැණික් ගැරීම |
| B. අරමුණ | 2. රාජ්‍ය මැණික් සංස්ථාව |
| C. පරිමාණය | 3. මැණික් ඔප දැමීම |
| D. කර්මාන්ත මූලය | 4. මැණික් කර්මාන්තය පිළිබඳ නොමිලයේ උපදේශනය |
| E. නිෂ්පාදනයේ ස්වභාවය | 5. සේවකයින් දෙදෙනෙකුගෙන් සමන්විත මැණික් ව්‍යාපාරය |

එක් එක් ව්‍යාපාර වර්ගීකරණ පදනමට ගැළපෙන නිදසුන නිවැරදි ව දක්වා ඇති කාණ්ඩය තෝරන්න.
(1) A - 2, B - 5, C - 3, D - 4, E - 1 (2) A - 2, B - 4, C - 5, D - 1, E - 3
(3) A - 2, B - 3, C - 4, D - 1, E - 5 (4) A - 1, B - 3, C - 2, D - 5, E - 4
(5) A - 4, B - 2, C - 5, D - 1, E - 3 (......)

**5.** සමන්ත විසින් බේකරි නිෂ්පාදන මිල දී ගෙන අලෙවි කිරීම සඳහා 'සමන්ත හෝටලය' නමින් ව්‍යාපාරයක් පළාත් සභාවේ ද අනුමැතිය ලබාගෙන, ඇඟලුම් කම්හලක් ආසන්නයේ පිහිටි ඔහුගේ නිවසෙහි ආරම්භ කරන ලදී. එයට සේවකයින් දෙදෙනකු බඳවාගත් අතර හෝටලයේ කළමනාකාරිත්වය ඔහුගේ පුතුට පවරනු ලැබීය.
ඒ අනුව සමන්තගේ ව්‍යාපාරය කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශ්වයන් ගණන
(1) 3 කි. (2) 4 කි. (3) 5 කි. (4) 6 කි. (5) 7 කි. (......)

[ දෙවැනි පිටුව බලන්න.

**6.** පහත වගුවේ දැක්වෙන්නේ සාර්ව පාරිසරික සාධක කිහිපයක් හා එම සාධක සඳහා නිදසුන් කිහිපයකි.

| සාර්ව පාරිසරික සාධක | නිදසුන් |
|---|---|
| A. ප්‍රජා විද්‍යාත්මක | 1. රොබෝ තාක්ෂණය දියුණු වීම |
| B. තාක්ෂණික | 2. වයස්ගත ජනගහනයේ වර්ධනය |
| C. ආර්ථික | 3. ලෝක වෙළෙඳපොළේ තෙල් මිල ඉහළ යාම |
| D. දේශපාලන | 4. භාවිත කළ හැකි පොලිතීන් ඝනත්වය නියම කිරීම |
| E. නීතිමය | 5. පස් අවුරුදු ජාතික සංවර්ධන සැලැස්මක් ඉදිරිපත් කිරීම |

සාර්ව පාරිසරික සාධක හා නිදසුන් නිවැරදි ව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A - 1, B - 2, C - 3, D - 4, E - 5
(2) A - 4, B - 5, C - 2, D - 3, E - 1
(3) A - 2, B - 1, C - 3, D - 5, E - 4
(4) A - 4, B - 3, C - 5, D - 2, E - 1
(5) A - 2, B - 1, C - 5, D - 3, E - 4 (……)

**7.** ව්‍යාපාර ආයතනයක් විසින් එක් එක් පාර්ශ්වවලට සමාජ වගකීම් ඉටු කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාකාරකම් කිහිපයක් හා ඊට අදාළ පාර්ශ්වවල ලැයිස්තුවක් පහත වගුවේ දැක්වේ.

| ක්‍රියාකාරකම් | පාර්ශ්ව |
|---|---|
| A. ආයතනය තුළ වෛද්‍ය ඒකකයක් පිහිටුවීම | 1. රජය |
| B. ජාතිය ගොඩනැගීමේ බද්දට දායක වීම | 2. ගනුදෙනුකරුවන් |
| C. ගිණුම් වාර්තා නියමිත ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම | 3. සේවකයන් |
| D. භාණ්ඩවල අන්තර්ගතය ලේබලයේ සඳහන් කිරීම | 4. අයිතිකරුවන් |

ඉහත ක්‍රියාකාරකම් හා ඊට අදාළ පාර්ශ්ව නිවැරදි ව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A - 1, B - 3, C - 2, D - 4
(2) A - 1, B - 3, C - 4, D - 2
(3) A - 2, B - 4, C - 3, D - 1
(4) A - 3, B - 1, C - 2, D - 4
(5) A - 3, B - 1, C - 4, D - 2 (……)

**8.** ව්‍යාපාරයක් විසින් තම තරගකරුවන් සැලකිල්ලට ගනිමින් ගොඩ නගා ඇති ආචාර ධර්මයක් වන්නේ,

(1) සියලු සේවකයින්ට සමානව සැලකීමයි.
(2) ප්‍රචාරණයේ දී අන් ව්‍යාපාරික ප්‍රතිරූපවලට හානි නොකිරීමයි.
(3) ආගමික සංකේත ව්‍යාපාර කටයුතුවලට යොදා නොගැනීමයි.
(4) ඉහළ ගුණාත්මකයකින් යුත් භාණ්ඩ සැපයීමයි.
(5) වැඩිහිටියන්ට ආචාරශීලී වීමයි. (……)

**9.** පහත සඳහන් දැ අතුරෙන් රාජ්‍ය බදු ආදායමක් ලෙස සැලකිය හැක්කේ කුමක් ද?

(1) රියදුරු බලපත්‍ර ගාස්තු
(2) දුම්රිය ගාස්තු
(3) වරිපනම් ගාස්තු
(4) තැපැල් ගාස්තු
(5) බැංකු ගාස්තු (……)

**10.** වෙළෙඳ විෂමාචාරයක් ලෙස සැලකිය හැක්කේ පහත දැ අතුරෙන් කුමක් ද?

(1) සේවකයින්ට නියමිත දිනට වැටුප් නොගෙවීම
(2) ව්‍යාපාරික ස්ථානය පිරිසිදුව තබා නොගැනීම
(3) සේවකයකු රැකියාවෙන් ඉවත් කිරීම
(4) ලකුණු කළ මිලට වඩා වැඩි මිලකට භාණ්ඩ විකිණීම
(5) ගනුදෙනුකරුවන් සමග මනා සබඳතාවයක් පවත්වා නොගැනීම (……)

**11.** වරලත් ව්‍යාපාරයක් තුළින් වරලත්ලාභියකුට අත් වන වාසියක් වන්නේ,

(1) ආයෝජනය පිළිබඳ අවදානමක් නොමැති වීමයි.
(2) ලාභය නිශ්චිත වීමයි.
(3) අඩු පිරිවැයකින් වරලත් ව්‍යාපාර බලපත්‍රය ලබා ගැනීමට හැකි වීමයි.
(4) ස්වාධීනව තම ව්‍යාපාර කටයුතු කිරීමට හැකි වීමයි.
(5) වරලත්හිමියාගෙන් පුහුණුව හා උපදෙස් ලබා ගැනීමට හැකි වීමයි. (……)

**12.** 2007 අංක 07 දරන සමාගම් පණතෙහි සඳහන් වන හවුල් ව්‍යාපාරවලට අදාළ කරුණක් වන්නේ,

(1) හවුල්කරුවන්ගේ ආරවුල් බේරුම් කිරීමයි.
(2) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනයයි.
(3) හවුල් ව්‍යාපාර ලියාපදිංචි කිරීමයි.
(4) හවුල්කරුවන් සංඛ්‍යාවයි.
(5) හවුල් ව්‍යාපාර විසුරුවා හැරීමයි. (………)

**13.** පහත දැක්වෙන්නේ විවිධ ව්‍යාපාර සංවිධානවලට අදාළ ලක්ෂණ කිහිපයකි.

A - වාර්ෂික ගිණුම් වාර්තා ප්‍රසිද්ධ කිරීම
B - අයිතිකරුවන්ගෙන් වෙන් වූ නීතිමය ඒකකයක් වීම
C - පාලනයට අයිතිකරුවන් අනිවාර්යෙන් ම සම්බන්ධ විය යුතු වීම
D - ලියාපදිංචිය අනිවාර්ය වීම
E - දක්ෂ කළමනාකරුවන් බඳවා ගැනීමට හැකි වීම
F - අයිතිකරුවන්ගේ වගකීම සීමාසහිත වීම

ඉහත දැ අකුරෙන් සීමාසහිත පොදු සමාගමක (PLC) ලක්ෂණ පමණක් අඩංගු කාණ්ඩය තෝරන්න.

(1) A, B, C, D (2) A, B, D, E (3) A, B, D, F (4) A, C, D, F (5) C, D, E, F (......)

**14.** පහත දක්වා ඇත්තේ සමූපකාර ව්‍යාපාරය හා සම්බන්ධ කරුණු කිහිපයකි.

A - ප්‍රජාතන්ත්‍රවාදී සාමාජික පාලනය
B - රජය පිළිබඳ සැලකිලිමත් වීම
C - සමූපකාර අධ්‍යාපනය, පුහුණුව හා තොරතුරු ලබා දීම
D - භාණ්ඩ හා සේවා අඩු මිලට විකිණීම
E - ස්වෛරීභාවය හා නිදහස
F - විවිධ ක්ෂේත්‍රවල ව්‍යාපාර කටයුතුවල නිරත වීම

ඉහත දැ අකුරෙන් සමූපකාර ප්‍රතිපත්ති පමණක් ඇතුළත් කාණ්ඩය කුමක් ද?

(1) A, B, C (2) A, B, E (3) A, C, E (4) A, C, F (5) B, D, E (......)

**15.** ව්‍යවසායකත්වය තුළින් ව්‍යවසායකයකුට අත් වන පුද්ගල ප්‍රතිලාභයක් වන්නේ,

(1) දළ දේශීය ආදායම වැඩි වීමයි.
(2) සේවා නියුක්තිය වැඩි වීමයි.
(3) සමාජ තත්ත්වය හා පිළිගැනීම වැඩි වීමයි.
(4) නව භාණ්ඩ හා සේවා පරිභෝජනයට අවස්ථා වැඩි වීමයි.
(5) ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ යාමයි. (......)

**16.** 'සමාජයීය ව්‍යවසායකත්වය' වඩාත් හොඳින් විස්තර කෙරෙන්නේ,

(1) අවතැන් වූ පුද්ගලයින් සඳහා කුඩාරම් සැපයීම යන්නෙනි.
(2) පාසල් ළමයින් සඳහා නොමිලයේ පොත්පත් බෙදා දීම යන්නෙනි.
(3) තම ව්‍යාපාරයට පවුලේ සාමාජිකයින් හවුල් කර ගැනීම යන්නෙනි.
(4) ඉන්ධන භාවිතය අවම කිරීම සඳහා නවතම උපකරණයක් නිෂ්පාදනය කිරීම යන්නෙනි.
(5) ආබාධිත තරුණ තරුණියන්ට ආයතනය තුළ 10%ක රැකියා ප්‍රතිශතයක් ලබා දීම යන්නෙනි. (......)

**17.** ස්වයංක්‍රීය බැංකු සේවා (Automated Banking Services) තුළින් බැංකුවකට පමණක් අත් වන වාසියක් වන්නේ,

(1) කාලය ඉතිරි කර ගැනීමට හැකි වීමයි.
(2) සේවා ව්‍යාප්තියෙන් වැඩි ලාභයක් ලැබීමට හැකි වීමයි.
(3) බිල්පත් ගෙවීම පහසු වීමයි.
(4) ගිණුම් පිළිබඳ තොරතුරු පහසුවෙන් ලබා ගැනීමට හැකි වීමයි.
(5) ගිණුම් අතර මුදල් හුවමාරු කිරීමට හැකි වීමයි. (......)

**18.** 'විද්‍යුත් ව්‍යාපාර' (e-business) වඩාත් හොඳින් විස්තර කෙරෙන්නේ,

(1) පරිගණක ඇසුරෙන් වෙළෙඳ කටයුතුවල නියුතු වීම යන්නෙනි.
(2) ගනුදෙනු සිදු කිරීම සඳහා විද්‍යුත් ජාල භාවිත කිරීම යන්නෙනි.
(3) සමස්ත ව්‍යාපාර ක්‍රියාවලිය මෙහෙයවීම සඳහා විද්‍යුත් ජාල භාවිත කිරීම යන්නෙනි.
(4) ගනුදෙනු සඳහා විද්‍යුත් මුදල් භාවිත කිරීම යන්නෙනි.
(5) ව්‍යාපාර ගිණුම් පිළියෙල කිරීම සඳහා මෘදුකාංග භාවිත කිරීම යන්නෙනි. (......)

**19.** අපනයන ක්‍රියාවලියේ දී නිර්යාතකරුවකුට තම භාණ්ඩවල වටිනාකම නිශ්චිතව ම ලබා ගැනීම තහවුරු කරන ක්‍රමය කුමක් ද?

(1) නෞභාරපත (2) ණයවර ලිපිය (3) පොරොන්දු නෝට්ටුව
(4) රක්ෂණ සහතිකය (5) චෙක්පත (......)

**20.** මංගත ක්‍රමයට භාණ්ඩ මිල දී ගැනීමේ (Online Purchasing) අවස්ථාවකට පමණක් සුවිශේෂී වූ ලක්ෂණය වන්නේ,

(1) භාණ්ඩ තේරීමට හැකි වීම ය.
(2) භාණ්ඩවල මිල ගණන් සැසඳීමට හැකි වීම ය.
(3) අවශ්‍ය භාණ්ඩවලට පමණක් අවධානය යොමු කිරීමට හැකි වීම ය.
(4) ණයපත් මගින් ගෙවීම් කිරීමට හැකි වීම ය.
(5) කෝවල් කිරීමට හැකි වීම ය. (......)

[ හතරවැනි පිටුව බලන්න.

**21.** ව්‍යාපාර ආයතනයකට කාර්යක්ෂමතාව ළඟාකර ගැනීම සඳහා ඉවහල් වන සාධකයක් වන්නේ,
(1) පරිසරය අනුව වෙනස් වීමයි. (2) මනාව සැලසුම් සකස් කිරීමයි.
(3) සමාජ වගකීම් ඉටු කිරීමයි. (4) සම්පත් අපතය අවම කර ගැනීමයි.
(5) තරගකාරිත්වයට සාර්ථකව මුහුණ දීමයි. (……)

**22.** විධායක උපකාරක පද්ධති (Executive Support Systems) පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මධ්‍ය කළමනාකරණ තීරණ ගැනීම සඳහා සහාය වන පද්ධතියකි.
(2) ඉහළ කළමනාකරණ තීරණ ගැනීම සඳහා සහාය වන පද්ධතියකි.
(3) සන්නිවේදන ක්‍රියාවලියට සහාය වන පද්ධතියකි.
(4) කාලීන වාර්තා සැකසීමට තොරතුරු සපයන පද්ධතියකි.
(5) දෛනික මෙහෙයුම් කටයුතුවලට අදාළ දත්ත වාර්තා කිරීමේ පද්ධතියකි. (……)

**23.** අග්‍ර කළමනාකරුවන් සඳහා සංකල්පනාත්මක කුසලතාව වැදගත් වන්නේ කුමන හේතුවක් නිසා ද?
(1) එදිනෙදා ව්‍යාපාර කටයුතු සාර්ථක කර ගැනීම සඳහා
(2) තීරණ වඩා හොඳින් ක්‍රියාත්මක කිරීම සඳහා
(3) අන්තර් පුද්ගල සම්බන්ධතා වර්ධනය කර ගැනීම සඳහා
(4) දිගු කාලීන උපාය මාර්ගික තීරණ ගැනීම සඳහා
(5) පහළ මට්ටමේ කළමනාකරුවන් අධීක්ෂණය සඳහා (……)

**24.** පහත **X** තීරුවේ කළමනාකරණ තනතුරු යුගල කිහිපයක් හා **Y** තීරුවේ දෙපාර්තමේන්තුකරණය කිරීමේ පදනම් කිහිපයක් ඇතුළත් වේ.

| X | Y |
|---|---|
| A. මූල්‍ය කළමනාකරු, අලෙවි කළමනාකරු | 1. නිෂ්පාදිත |
| B. ඇඟලුම් නිෂ්පාදන කළමනාකරු, සම් භාණ්ඩ නිෂ්පාදන කළමනාකරු | 2. ක්‍රියාවලි |
| C. තොග අලෙවි කළමනාකරු, සිල්ලර අලෙවි කළමනාකරු | 3. ශ්‍රිතමය |
| D. තත්ත්ව පරීක්ෂණ කළමනාකරු, ඇසුරුම් කළමනාකරු | 4. ගනුදෙනුකරු |

කළමනාකරණ තනතුරු අනුව දෙපාර්තමේන්තුකරණ පදනම් නිවැරදි ව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.
(1) A - 1, B - 2, C - 3, D - 4 (2) A - 3, B - 1, C - 4, D - 2 (3) A - 3, B - 1, C - 2, D - 4
(4) A - 2, B - 4, C - 1, D - 3 (5) A - 2, B - 1, C - 4, D - 3 (……)

**25.** පහත වගුවේ **X** තීරුව මගින් අලෙවිකරණ සන්නිවේදන මිශ්‍ර (අලෙවි ප්‍රවර්ධන ක්‍රම) හා **Y** තීරුව මගින් ඒ සඳහා නිදසුන් කිහිපයක් දැක්වේ.

| X | Y |
|---|---|
| A. ප්‍රචාරණය | 1. කූපපත් ඇදීම මගින් ත්‍යාග පිරිනැමීම |
| B. විකුණුම් ප්‍රවර්ධනය | 2. රූපවාහිනී දැන්වීම් පළ කිරීම |
| C. මහජන සම්බන්ධතා | 3. ගෙයින් ගෙට ගොස් භාණ්ඩ අලෙවි කිරීම |
| D. පුද්ගල අලෙවිය | 4. ක්‍රීඩා උත්සව සඳහා අනුග්‍රාහකත්වය ලබා දීම |

අලෙවිකරණ සන්නිවේදන මිශ්‍ර අනුව නිදසුන් නිවැරදි ව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.
(1) A - 1, B - 4, C - 2, D - 3 (2) A - 2, B - 1, C - 4, D - 3 (3) A - 2, B - 3, C - 1, D - 4
(4) A - 3, B - 2, C - 4, D - 1 (5) A - 4, B - 2, C - 3, D - 1 (……)

**26.** සේවකයකුට නායකත්ව නිපුණතාව ප්‍රගුණ කර ගත හැකි පුහුණු ක්‍රමය වන්නේ,
(1) තාක්ෂණික පුහුණුවයි. (2) චර්යා සම්බන්ධ පුහුණුවයි. (3) රැකියාව තුළින් පුහුණුවයි.
(4) සමාකරණ පුහුණුවයි. (5) ආධුනිකත්ව පුහුණුවයි. (……)

**27.** පහත වගුවේ දැක්වෙන්නේ සංවිධානයක කාර්ය කිහිපයක් හා කළමනාකරණ ශ්‍රිත වේ.

| කාර්යය | ශ්‍රිත |
|---|---|
| A. වැඩ බෙදීම | 1. සැලසුම්කරණය |
| B. සේවක අභිප්‍රේරණය | 2. සංවිධානකරණය |
| C. ප්‍රමිති ස්ථාපිත කිරීම | 3. මෙහෙයවීම |
| D. පරිසර විශ්ලේෂණය | 4. පාලනය |

සංවිධාන කාර්යය අනුව ඊට අදාළ කළමනාකරණ ශ්‍රිතය නිවැරදි ව ගළපා ඇති කාණ්ඩය කුමක් ද?
(1) A - 1, B - 2, C - 3, D - 4 (2) A - 2, B - 1, C - 4, D - 3 (3) A - 3, B - 4, C - 2, D - 1
(4) A - 2, B - 3, C - 4, D - 1 (5) A - 4, B - 3, C - 2, D - 1 (……)

[ පස්වැනි පිටුව බලන්න.

**28.** කොළඹ කොටස් හුවමාරුවෙහි කාර්ය සඳහා සෘජුව ම සම්බන්ධ **නො වන** පාර්ශ්වය කුමක් ද?
(1) ලැයිස්තුගත සමාගම්
(2) සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
(3) තැරැව්කාර සමාගම්
(4) භාරකාර බැංකු
(5) සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
(......)

**29.** සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය හා සංචිතවල එකතුවට වඩා ණය ප්‍රාග්ධනය අඩු නම් එම අනුපාතය හඳුන්වන්නේ,
(1) අධිතෝලන අනුපාතය ලෙස ය.
(2) ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතය ලෙස ය.
(3) අවතෝලන අනුපාතය ලෙස ය.
(4) ක්ෂණික අනුපාතය ලෙස ය.
(5) ජංගම අනුපාතය ලෙස ය.
(......)

**30.** සෘජු හා අභ්‍යන්තර අරමුදල් සම්පාදන මාර්ගයක් වන්නේ,
(1) කොටස් නිකුතුව ය.
(2) බැංකු ණය ය.
(3) ණයකර නිකුතුව ය.
(4) රඳවාගත් ලාභ ය.
(5) කල්බදු ය.
(......)

● අංක **31** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **සුදුසු වචන** යොදා හිස්තැන් පුරවන්න.

**31.** (අ) වෙළෙඳපොළ .......................... මෙන් ම .......................... ක්‍රම හරහා ද නිර්මාණය වේ.

(ආ) පාරිභෝගිකයා විසින් භාණ්ඩයේ මිල, ගුණත්වය හා මෝස්තරය සැසඳීමෙන් පසුව මිල දී ගන්නේ .......................... භාණ්ඩ වන අතර, විශේෂිත ප්‍රයත්නයකින් තොර ව නිරන්තරයෙන් මිල දී ගන්නේ .......................... භාණ්ඩ වේ.

**32.** (අ) ආයතනයක අයිතිකරුවන්, කළමනාකරුවන් හා සේවකයින්ගේ විශ්වාස, වටිනාකම්, ආකල්ප යනාදිය මත සංවිධානයේ ................................ සකස් වේ.

(ආ) රජයට අවශ්‍ය කෙටි කාලීන ණය සපයා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් .......................... .......................... නිකුත් කරන අතර, මධ්‍ය හා දිගු කාලීන ණය සපයා ගැනීම සඳහා .......................... .......................... නිකුත් කෙරේ.

**33.** (අ) හවුල් ව්‍යාපාරයක් ලිඛිතව හෝ .......................... හෝ .......................... හෝ ඇති කරගත හැකි ය.

(ආ) සමාගම් විසින්, තම .......................... මත මෙන් ම කොටස්කරුවන්ට හිමි වන .......................... මත ද ආදායම් බදු ගෙවීම ද්විත්ව බදුකරණය (Double Taxation) නමින් හැඳින් වේ.

**34.** පහත දැක්වෙන එක් එක් ප්‍රකාශ **සත්‍ය** හෝ **අසත්‍ය** බව සඳහන් කරන්න.

| | **ප්‍රකාශය** | **සත්‍ය / අසත්‍ය** |
|---|---|---|
| 1. | කේවල ස්වාමි ව්‍යාපාරයක් තම නමින් ආදායම් බදු ගෙවනු ලැබේ. | .......................... |
| 2. | අවදානම් දැරීම ව්‍යවසායකත්වයේ ලක්ෂණයකි. | .......................... |
| 3. | දත්ත හා තොරතුරු අතර වෙනසක් නැත. | .......................... |
| 4. | මුළු නිෂ්පාදන පිරිවැය, නිෂ්පාදන ඒකක ගණනින් බෙදීමෙන් ඒකකයක නිෂ්පාදන පිරිවැය ගණනය කළ හැකි ය. | .......................... |

**35.** (අ) ජංගම ගිණුම් හිමියා, චෙක්පතක .......................... වන අතර, චෙක්පතේ නම සඳහන් පුද්ගලයා .......................... වේ.

(ආ) කෙටි කාලීන (තාවකාලික) බැංකු අයිරා පහසුකම් .......................... ඇප මත ලබාගත හැකි අතර, දිගු කාලීන (ස්ථාවර) බැංකු අයිරා පහසුකම් .......................... ඇප මත ලබාගත හැකි වේ.

**36.** (අ) මූල්‍ය ආයතන වර්ගීකරණය අනුව සේවක භාරකාර අරමුදල.......................... ඉතිරි කිරීමේ ආයතනයක් වන අතර, ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් .......................... මූල්‍ය ආයතන වේ.

(ආ) විද්‍යුත් ගනුදෙනුවක් සිදු කිරීමේ දී එයට සම්බන්ධ වන පාර්ශ්වකරුවන් වන්නේ කාඩ්පත් හිමියා, වෙළෙන්දා, .......................... හා .......................... වේ.

**37.** (අ) මෝටර් රථය හා එහි ගමන් කරන මගීන්ට, බාහිර පාර්ශ්වයන්ට හා සියලු ම දේපළවලට සිදු වන හානි සඳහා ආවරණය ලබා ගැනීමට හැකි වන්නේ .................................... රක්ෂණ ඔප්පුව මගින් වන අතර, බාහිර පාර්ශ්වයන්ට හා දේපළවලට සිදු වන හානි සඳහා පමණක් ආවරණය ලබාගත හැකි වන්නේ .................................... රක්ෂණ ඔප්පුව මගිනි.

(ආ) නිෂ්පාදකයකු, තම භාණ්ඩ තමා විසින් ම අපනයනය කිරීම ................................ ක්‍රමය ලෙස ද, බාහිර පාර්ශ්වයක් මගින් අපනයනය කිරීම.................................. ක්‍රමය ලෙස ද හඳුන්වයි.

**38.** (අ) බුද්ධිමය දේපළ හිමිකම් පනත යටතේ, ග්‍රන්ථ සඳහා නීතිමය වශයෙන් ලැබෙන අයිතිය............................................. වන අතර, නවෝත්පාදන සඳහා ලැබෙන තාවකාලික ඒකාධිකාරී නීතිමය අයිතිය ...................................... වේ.

(ආ) ව්‍යාපාරයක විවිධ භාණ්ඩ සඳහා විවිධ සන්නම් නාම භාවිත කිරීම................................ සන්නම වන අතර, එක ම සන්නම යටතේ භාණ්ඩ පෙළක් ඉදිරිපත් කිරීම ........................... සන්නම වේ.

**39.** (අ) තමා විසින් ම තීරණ ගෙන අනුගාමිකයින් ලවා ක්‍රියාත්මක කරවන්නේ ............................ නායකත්වය වන අතර, පොදු එකඟත්වය මත තීරණ ගෙන අනුගාමිකයින් ලවා ක්‍රියාත්මක කරවන්නේ ............................ නායකත්වය වේ.

(ආ) ආයතනයක කළමනාකරුවකුට ඔහුගේ දැනුම හා කුසලතා මත ............................... බලය හිමි වන අතර, සේවකයන් වෙත ප්‍රසාද දීමනා ලබා දීමට හැකිවන්නේ .................................... බලය මත වේ.

**40.** ව්‍යාපාර ආයතනයකට අදාළ, පහත දැක්වෙන එක් එක් ක්‍රියාකාරකම සඳහා ගැළපෙන මානව සම්පත් කළමනාකරණ ශ්‍රිතයට අයත් කාර්යය හිස්තැන මත ලියන්න.

| **ක්‍රියාකාරකම** | **මානව සම්පත් කළමනාකරණ කාර්යය** |
|---|---|
| 1. නව සේවකයන් බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පළ කිරීම | ........................................ |
| 2. අයදුම්කරුවන්ගේ සාමාන්‍ය දැනුම ඇගයීම සඳහා ලිඛිත පරීක්ෂණයක් පැවැත්වීම | ........................................ |
| 3. නව සේවකයකු රැකියාවේ නියුක්ත කිරීම තුළින් ම රැකියාවේ කාර්යයන් ඉගෙනීම | ........................................ |
| 4. සේවක ඵල ඇගයීම සඳහා ලකුණු ක්‍රමයක් හඳුන්වා දීම | ........................................ |

● අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට **නිශ්චිත පිළිතුරු** සපයන්න.

**41.** ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ සිට අවසානය දක්වා විවිධ උපකාරක සේවා අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ එම සේවා සපයන රාජ්‍ය පරිපාලන ව්‍යුහ මට්ටම් **හතරක්** නම් කරන්න.

1. ............................................... 2. ...............................................

3. ............................................... 4. ...............................................

**42.** ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර වෙළෙඳපොළ සමීක්ෂණය කිරීමේ දී සැලකිය යුතු ප්‍රධාන කරුණු **හතරක්** ලියන්න.

1. ........................................................................................................

2. ........................................................................................................

3. ........................................................................................................

4. ........................................................................................................

**43.** සැපයුම්කරුවන්, ව්‍යාපාරයකට තර්ජනයක් විය හැකි ආකාර **හතරක්** සඳහන් කරන්න.

1. ........................................
2. ........................................
3. ........................................
4. ........................................

**44.** ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ප්‍රමිති ක්‍රියාත්මක කරන ආකාර **හතරක්** සඳහන් කරන්න.

1. ........................................
2. ........................................
3. ........................................
4. ........................................

**45.** සැලසුම් සකස් කිරීමේ මූලධර්ම **හතරක්** ලියන්න.

1. ........................................
2. ........................................
3. ........................................
4. ........................................

**46.** උපරිම තොග මට්ටම ගණනය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු සාධක **හතරක්** ලියන්න.

1. ........................................
2. ........................................
3. ........................................
4. ........................................

**47.** පහත දැක්වෙන සංකේත මගින් හඳුන්වනු ලබන්නේ කුමක් ද?

1. ® ........................................
2. € ........................................
3.  ........................................
4.  ........................................

**48.** පාරිභෝගික දෘෂ්ටියෙන් සලකා බලන විට අලෙවිකරණ මිශ්‍රය තුළ ඇතුළත් වන විචල්‍ය **හතර** සඳහන් කරන්න.

1. .................... 2. ....................
3. .................... 4. ....................

**49.** තොරතුරු පද්ධතියක ප්‍රධාන කාර්ය **හතර** ලියන්න.

1. .................................................. 2. ..................................................................

3. .................................................. 4. ..................................................................

**50.** මූල්‍ය සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතා **හතරක්** ලියන්න.

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

3. ..........................................................................................................................

4. ..........................................................................................................................

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

| | | |
|---|---|---|
| ව්‍යාපාර අධ්‍යයනය II<br>வணிகக் கல்வி II<br>Business Studies II | 32 S II | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

**උපදෙස්:**

✻ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) (අ) ව්‍යාපාරයක මූලික ශ්‍රිත (කාර්ය) **හතරක්** සඳහන් කරන්න.

(ආ) ගනුදෙනුකරුවන් හා තරගකරුවන් වෙන් වෙන් වශයෙන් ව්‍යාපාරයකට අවස්ථාවක් හා තර්ජනයක් වන්නේ කෙසේ දැයි දැක්වීම සඳහා උදාහරණය බැගින් ලියන්න. (ලකුණු 04 යි)

(ii) (අ) ව්‍යාපාරිකයකු විසින් බැංකුවකින් ලබාගත් ණය මුදලක් ආපසු නොගෙවීම, බැංකුවට හා ව්‍යාපාරිකයාට බලපාන ආකාරය දක්වන්න.

(ආ) සංවිධාන සංස්කෘතිය තුළ ඇති ශක්තියක් හා දුර්වලතාවයක් සඳහා උදාහරණය බැගින් දක්වා, පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) පහත දක්වා ඇති සාර්ව පාරිසරික සාධක අතර පවතින අන්තර් සම්බන්ධතාව එක් උදාහරණයක් බැගින් දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න.

(අ) ස්වාභාවික පරිසරය - සමාජයීය හා සංස්කෘතික පරිසරය

(ආ) දේශපාලන පරිසරය - ආර්ථික පරිසරය (ලකුණු 04 යි)

(iv) (අ) සේවකයින්ගේ දෘෂ්ටියෙන් බලන විට සේව්‍ය පාර්ශ්වය විසින් සේවකයින්ට සිය වගකීම් ඉටු නොකළේ යැයි සැලකිය හැකි අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

(ආ) බස් රථයක ගමන් කරන මගියකු හා කොන්දොස්තර මහතකු විසින් පිළිපැදිය යුතු යැයි පොදුවේ පිළිගත් ආචාර ධර්ම **දෙක** බැගින් ලියන්න. (ලකුණු 04 යි)

(v) ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන බෝගයක් වන තේ කර්මාන්තයෙන් ආර්ථිකයට ලැබෙන දායකත්වය ක්‍රම ක්‍රමයෙන් අඩුවීමට බලපා ඇති ප්‍රධාන හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**2.** (i) (අ) "රජයක් විසින් විවිධාකාරයේ බදු පනවනු ලබයි." මෙසේ බදු පැනවීම, ව්‍යාපාර කෙරෙහි බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ආ) මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ණය සීමා පැනවීමේ අරමුණු **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) පාරිභෝගික අයිතීන් තහවුරු කිරීම තුළින් ව්‍යාපාරිකයකුට අත්කර ගත හැකි වාසි **දෙකක්** පැහැදිලි කරන්න.

(ආ) පුද්ගලයකු තම දියණියගේ නම යොදා ගනිමින් 'යසෝධා කේටරින් සර්විස්' නමින් ව්‍යාපාරයක් ආරම්භ කරන්නේ නම්, ඒ සඳහා අදාළ නීතිමය විධිවිධානය කුමක් ද? (ලකුණු 04 යි)

(iii) (අ) හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට වඩා කේවල ස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කිරීම යෝග්‍ය යැයි පුද්ගලයකු අදහස් කරයි. මෙම අදහසට එකඟවීම සඳහා හේතු **දෙකක්** දක්වන්න.

(ආ) සීමිත පොදු සමාගමක් හා සැසඳීමේ දී සීමිත පෞද්ගලික සමාගමක ඇති අවාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iv) සමුපකාර ව්‍යාපාරය ජනතාව අතර ජනප්‍රිය කරලීම සඳහා ඔබ විසින් කරනු ලබන යෝජනා **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) "රටක ආර්ථික සංවර්ධනයට ව්‍යවසායකත්වය දායක වෙයි." මෙම අදහස උදාහරණ සපයමින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

[ දෙවැනි පිටුව බලන්න.

**3.** (i) (අ) දැනට පවත්වාගෙන යන ව්‍යාපාරයක් අත්පත් කර ගැනීමෙන් ව්‍යාපාරිකයකුට ලැබෙන වාසි **දෙකක්** සඳහන් කරන්න.

(ආ) ව්‍යවසායකත්ව නිපුණතා **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) "කුඩා ව්‍යාපාර බොහොමයක් කෙටි කලකින් අසාර්ථක වේ." කුඩා ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතු **හතරක්** ඇසුරෙන් මෙම අදහස පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) ATM කාඩ්පතක් තිබුණ ද ඇතැම් ගනුදෙනුකරුවන් මුදල් ලබා ගැනීම සඳහා බැංකුවේ කවුන්ටරයට යන බව සමීක්ෂණයකින් හෙළි වී ඇත. ගනුදෙනුකරුවන් ATM කාඩ්පත් භාවිත **නොකිරීම** සඳහා බලපෑ හැකි හේතු **දෙකක්** දක්වන්න.

(ආ) මූල්‍ය සමාගම්වල කාර්ය **දෙකක්** සඳහන් කර, ඒවා ව්‍යාපාරවල වර්ධනයට දායක වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) ජංගම ගිණුම් භාවිතයෙන් ව්‍යාපාරිකයින්ට ඇති විය හැකි වාසි **දෙකක්** පැහැදිලි කරන්න.

(ආ) වර්තමානයේ ජංගම දුරකථනය විවිධ කටයුතු සඳහා භාවිත කරයි. ව්‍යාපාරික කටයුතු සඳහා ජංගම දුරකථනය යොදා ගත හැකි අවස්ථා **හතරකට** උදාහරණ දක්වන්න. (ලකුණු 04 යි)

(v) (අ) පාරිභෝගිකයකුට, ණය කාඩ්පතක් භාවිත කිරීම තුළින් හර කාඩ්පතක් භාවිත කිරීමට වඩා වැඩියෙන් ලබා ගත හැකි වාසි **දෙකක්** ලියන්න.

(ආ) රක්ෂණයෙන් ව්‍යාපාර සංවිධානවලට ලැබෙන වාසි **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**4.** (i) මේ වසරේ පාසල් විවාදයේ තේමාව, "ව්‍යාපාර දියුණුව සඳහා මහාමාර්ග සංවර්ධනයට වඩා දුම්රිය මාර්ග සංවර්ධනය වැදගත් වේ." යන්නයි. පාසලේ විවාද කණ්ඩායමේ සාමාජිකයකු ලෙස ඔබ එම මතයට පක්ෂව හා විපක්ෂව ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන කරුණු **දෙක** බැගින් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) මුහුණට මුහුණලා කෙරෙන වාචික සන්නිවේදනයේ ඇති විය හැකි ගැටළු **හතරක්** සඳහන් කරන්න.

(ආ) අන්තර්ජාලය හරහා ලිපි ගනුදෙනු කිරීමේ වාසි හා අවාසි **දෙක** බැගින් ලියන්න. (ලකුණු 04 යි)

(iii) (අ) කෘෂිකාර්මික නිෂ්පාදිතවල මිල ගණන් ඉහළ යාමට ගොවියා හා වෙළෙන්දා යන දෙදෙනා ම වගකිවයුතු වන බව උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

(ආ) ජාත්‍යන්තර වෙළෙඳපොළට පිවිසීමේ දී දේශීය ව්‍යාපාරිකයින්ට මුහුණ දීමට සිදු වන බාධක **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම් ඇති කර ගැනීම තුළින් ව්‍යාපාරවලට ඇති විය හැකි වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) (අ) විද්‍යුත් වෙළෙඳාමෙන් ව්‍යාපාරිකයකුට අත්පත් කර ගත හැකි වාසි **දෙකක්** සඳහන් කරන්න.

(ආ) විද්‍යුත් වෙළෙඳාමෙන් පාරිභෝගිකයකුට ඇති වන අවාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

## II කොටස

**5.** (i) (අ) කළමනාකරුවකුගේ එක් අන්තර්පුද්ගල භූමිකාවක් තෝරාගෙන එම භූමිකාව තුළ ඉටු කළ යුතු කාර්ය **දෙකක්** උදාහරණ දක්වමින් විස්තර කරන්න.

(ආ) කළමනාකරණ තීරණ සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන සාධක **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) රැකියා විශේෂීකරණය මගින් සේවකයකුට ඇති වන අවාසි **දෙකක්** විස්තර කරන්න.

(ආ) "සංවිධානයක සාර්ථකත්වයට හොඳ නායකත්වයක් අත්‍යවශ්‍ය වේ." මෙම අදහස හේතු දක්වමින් තහවුරු කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) නිෂ්පාදිතයක දෝෂ නිවැරදි කිරීම සඳහා පසු පෝෂණ පාලන අදියරේ දී (Post feedback control stage) ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

(ආ) නිෂ්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේ දී ආයතනයක් විසින් සලකා බැලිය යුතු නිර්ණායක **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) ව්‍යාපාරයක මෙහෙයුම් කටයුතු සාර්ථක වීම සඳහා නිෂ්පාදන පර්යේෂණ හා සංවර්ධනය බලපාන ආකාර **හතරක්** විස්තර කරන්න.

(ආ) ප්‍රවාහ නිෂ්පාදනයේ හිතකර ලක්ෂණ **දෙකක්** දක්වන්න. (ලකුණු 04 යි)

(v) (අ) තොග පාලනයකින් ව්‍යාපාරයකට ලබා ගත හැකි වාසි **දෙකක්** විස්තර කරන්න.

(ආ) සංවිධානයකට ශ්‍රම ඵලදායිතාව වර්ධනය කර ගත හැකි ආකාර **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

[ තුන්වැනි පිටුව බලන්න.

**6.** (i) (අ) සමාජයීය අලෙවිකරණයේ ප්‍රධාන ලක්ෂණ **දෙකක්** විස්තර කරන්න.
(ආ) අලෙවිකරණ මිශ්‍රයේ 'ස්ථානය' (බෙදාහැරීම) නමැති විචල්‍යයට ඇතුළත් මූලිකාංග **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) ගුවන් විදුලි යන්ත්‍රයක් උදාහරණයට ගනිමින් 'අපේක්ෂිත නිෂ්පාදිතය' යන සංකල්පය පැහැදිලි කරන්න.
(ආ) නිෂ්පාදිතයක ලේබලයක් තුළින් පාරිභෝගිකයාට දැනගත හැකි තොරතුරු **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) යෝග්‍ය බෙදා හැරීමේ මාර්ගයක් තෝරා ගැනීමේ දී ව්‍යාපාරිකයකු විසින් සැලකිය යුතු ප්‍රධාන සාධක **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.
(ආ) සබන් නිෂ්පාදකයකුට, සබන් අලෙවිය වැඩිකර ගැනීම සඳහා යොදා ගත හැකි ක්‍රම **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) මූල්‍ය කළමනාකරණයේ ප්‍රධාන අරමුණු **දෙකක්** දක්වන්න.
(ආ) ණය මුදලක් ලබා ගැනීම සඳහා මූල්‍ය ආයතනයක් තෝරා ගැනීමේ දී ව්‍යාපාරිකයකු විසින් සැලකිලිමත් විය යුතු කරුණු **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(v) පහත මූල්‍ය අනුපාතවල අපේක්ෂිත හා සත්‍ය තත්ත්වය සසඳමින් ඒ පිළිබඳව ඔබගේ අදහස් දක්වා, අපේක්ෂිත තත්ත්වය ලඟා කර ගැනීම සඳහා ගත යුතු එක් ක්‍රියාමාර්ගයක් බැගින් යෝජනා කරන්න. (ඔබගේ පිළිතුරු පතෙහි අදහස් හා ගත යුතු ක්‍රියාමාර්ග පමණක් ලියන්න)

| අනුපාතය | අපේක්ෂිත තත්ත්වය | සත්‍ය තත්ත්වය | අදහස | ගත යුතු ක්‍රියාමාර්ගය |
|---|---|---|---|---|
| 1. තොග පිරිවැටුම (වාර) | 4 | 1 | | |
| 2. ණයගැති පිරිවැටුම (වාර) | 4 | 2 | | |

(ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

**7.** (i) (අ) මානව සම්පත් අවශ්‍යතා පුරෝකථනය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු **හතරක්** ලියන්න.
(ආ) රැකියා අයදුම්පතකින්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයකට අයදුම්කරුවකු පිළිබඳ ලබා ගත හැකි වැදගත් තොරතුරු **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(ii) සම්මුඛ පරීක්ෂණයකින් ඇතැම් විට නිවැරදි පුද්ගලයා තෝරා ගැනීම අපහසු වේ. එසේ වීමට බලපෑ හැකි කරුණු **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) කාර්යඵල ඇගයීමකින් සේවකයකුට ලැබෙන ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න.
(ආ) යහපත් සේව්‍ය-සේවක සම්බන්ධතාවක් පවත්වා ගැනීමට වෘත්තීය සමිතියක් විසින් ඉටු කළ යුතු කාර්ය **දෙකක්** දක්වන්න. (ලකුණු 04 යි)

(iv) ව්‍යාපාරයක දෛනික මෙහෙයුම් කටයුතුවලට සම්බන්ධ තොරතුරු දැක්වෙන පහත වගුව ව්‍යාපාර අංශ/දෙපාර්තමේන්තු සහ ගනුදෙනු සැකසුම් පද්ධති (Transaction Processing Systems) සැලකිල්ලට ගනිමින් අංක ①,②,③ සහ ④යන ස්ථානවලට අදාළ පිළිතුරු පමණක් ඔබගේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

| ව්‍යාපාර අංශය / දෙපාර්තමේන්තුව | ගනුදෙනු සැකසුම් පද්ධතිය |
|---|---|
| ① .................................. | ද්‍රව්‍ය මිලට ගැනීම |
| මානව සම්පත් | ② .................................. |
| ③ .................................. | මිල කිරීම |
| ගිණුම් | ④ .................................. |

(ලකුණු 04 යි)

(v) (අ) හොඳ තොරතුරක පැවතිය යුතු ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.
(ආ) ව්‍යාපාර ආයතනයකට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) භාවිතයෙන් ලැබිය හැකි ප්‍රතිලාභ **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

[ හතරවැනි පිටුව බලන්න.

**8.** (i) කෙටියෙන් විස්තර කරන්න.

(අ) විද්‍යුත් සම්මන්ත්‍රණ (e-conference)

(ආ) පාඨ කථනය (Text chatting)

(ඉ) හඬ කථනය (Voice chatting)

(ඊ) වීඩියෝ කථනය (Video chatting) (ලකුණු 04 යි)

(ii) විද්‍යුත් තොරතුරු පද්ධතියක ඇති උපාංග **හතරක්** පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) ව්‍යාපාර සැලැස්මක අවශ්‍යතාවට හේතු **දෙකක්** ලියන්න.

(ආ) ව්‍යාපාර අදහස් රාශියක් ඇසුරෙන් ක්‍රියාවට නැගිය හැකි අවසාන ව්‍යාපාර අදහස තෝරා ගැනීමේ ක්‍රියාවලියේ පියවර අනුපිළිවෙළ සැලකිල්ලට ගෙන පහත සටහන සම්පූර්ණ කරන්න. (ඔබගේ පිළිතුරු පතෙහි මෙම සටහන ඇඳ, පිළිතුරු සපයන්න.)

| **විශ්ලේෂණයේ ස්වභාවය** | | **ඇගයීමට ගන්නා සාධක වර්ගය** |
|---|---|---|
| 1. .......................... | → | ........................... |
| 2. .......................... | → | ........................... |

(ලකුණු 04 යි)

(iv) (අ) ව්‍යාපාරයක මූල්‍ය සැලැස්මෙහි ඇතුළත් විය යුතු ප්‍රධාන කොටස් **දෙකක්** නම් කරන්න.

(ආ) නිෂ්පාදන නොවන පිරිවැය සඳහා උදාහරණ **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(v) ව්‍යාපාරයක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන පුද්ගලයකුට මූල්‍ය විශ්ලේෂණයකින් ගත හැකි තීරණ **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

* * *

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, අගෝස්තු 2016
# General Certificate of Education (Adv.Level) Examination, August 2016
## ව්‍යාපාර අධ්‍යයනය - පිළිතුරු - I

### 2016 - පිළිතුරු පත්‍රය

| Question | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| 01 | | | | | X |
| 02 | | | | | X |
| 03 | | | X | | |
| 04 | | X | | | |
| 05 | | | | X | |
| 06 | | | X | | |
| 07 | | | | | X |
| 08 | | X | | | |
| 09 | | | X | | |
| 10 | | | | X | |
| 11 | | | | | X |
| 12 | | | | X | |
| 13 | | | X | | |
| 14 | | | X | | |
| 15 | | | X | | |
| 16 | | | | X | |
| 17 | | X | | | |
| 18 | | | X | | |
| 19 | | X | | | |
| 20 | | | X | | |
| 21 | | | | X | |
| 22 | | X | | | |
| 23 | | | | X | |
| 24 | | X | | | |
| 25 | | X | | | |
| 26 | | X | | | |
| 27 | | | | X | |
| 28 | | X | | | |
| 29 | | | X | | |
| 30 | | | | X | |

WWW.KLCCOMMERCE.COM

31 - 40 දක්වා එක් හිස්තැනකට අදාළ පිළිතුරට ලකුණු 1/2 බැගින්

31. (අ) භෞතික, විද්‍යුත්/ අවකාශ
    (ආ) සාප්පු, පහසු

32. (අ) සංස්කෘතිය
    (ආ) භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර

33. (අ) වාචික ව ඇඟවීමෙන්/හැසිරීමෙන්
    (ආ) මුළු ලාභය/ ලාභය, ලාභාංශ

34. 01. අසත්‍ය
    02. සත්‍ය
    03. අසත්‍ය
    04. සත්‍ය

35. (අ) අණකරු, අදායකයා
    (ආ) පුද්ගල, දේපළ

36. (අ) ශිව්සුම්ගත, අනෙකුත් විශේෂිත
    (ආ) ණයපත් සංගමය, ණයපත් නිකුත් කරන ආයතනය/ බැංකුව

37. (අ) විස්තීරණ/ සම්පූර්ණ වගකීම් සහිත, අවම තෙවන පක්ෂ
    (ආ) ඍජු, නියෝජිත/ඉන්ඩෙන්ට්/වක්‍ර

38. 1. ලිපි හිමිකම/ප්‍රකාශන අයිතිය, පේටන්ට් බලපත්‍රය
    2. භාණ්ඩ, පවුල්

39. (අ) ඒකාධිපති, ප්‍රජාතන්ත්‍රවාදී
    (ආ) විශේෂඥ, තෑගි දීමේ

40. 01. සේවක ආකර්ෂණය
    02. තෝරාගැනීම
    03. පුහුණුව/රැකියාව තුළ පුහුණුව
    04. කාර්යඵල ඇගයීම/කාර්ය සාධන ඇගයීම

41 - 45 දක්වා එක් හිස්තැනකට අදාළ පිළිතුරට ලකුණු 1/2 බැගින්

41. 01. මධ්‍යම රජය
    02. පළාත් සභා
    03 හා 04 සඳහා පළාත් පාලන ආයතන/මහ නගර සභා/ ප්‍රාදේශීය සභා යන පිළිතුරුවලින් ඕනෑ ම දෙකක්

42. 01. ගනුදෙනුකරුවන් පිළිබද ව / පාරිභෝගික ඉල්ලුම
    02. තරගකරුවන් පිළිබඳ ව
    03. සමාජ හා සංස්කෘතික සාධක පිළිබඳ ව
    04. ආවරණ ප්‍රදේශය/ඉලක්ක වෙළෙඳ පොළ පිළිබඳ ව
    05. නිෂ්පාදිත වර්ග පිළිබඳ ව
    06. මිල

43. 01. කලට වේලාවට ද්‍රව්‍ය නොසැපයීම
    02. ගුණාත්මක බවින් අඩු ද්‍රව්‍ය ලබාදීම
    03. අසාධාරණ කොන්දේසි පැනවීම
    04. ද්‍රව්‍ය මිල ගණන් කේවල් කිරීම
    05. අඛණ්ඩ ව ද්‍රව්‍ය ලබා නොදීම/ ප්‍රමාණවත් භාණ්ඩ ලබා නොදීම
    06. සැපයුම්කරුවන්ගේසාමූහිකශක්තිය/ සැපයුම්කරුවන්ගේ වෘත්තීය සමිති

44. 1. ස්වේච්ඡාවෙන්
    2. SLS සහතික ලාංඡන ක්‍රමය මඟින්
    3. පූර්ව අපනයන පරීක්ෂාව මඟින්
    4. ආනයන පරීක්ෂාව මඟින්
    5. සහතික නිකුත් කිරීම මඟින්

45. 1. අරමුණු හා පරමාර්ථ මත පදනම් වීම
    2. ප්‍රායෝගික වීම
    3. නම්‍යශීලී බව
    4. තේරුම් ගැනීම පහසු වීම / සරල බව
    5. නිශ්චිත කාල සීමාවක් තිබීම
    6. සෙසු කළමනාකරණ කාර්යයන්ට පෙර සැකසීම / සෙසු කලමනාකරණ කාර්යයන් සමග සම්බන්ධතාවක් පැවතීම
    3. සෑම මට්ටමක ම කළමනාකරුවන් සහභාගි කරවා ගැනීම

46. 1. යළි ඇනවුම් මට්ටම
    2. අවම තොග භාවිතය
    3. අවම ඇණවුම් කාලය
    4. යළි ඇණවුම් ප්‍රමාණය/ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ)

47. 1. ලියාපදිංචි වෙළෙඳ ලකුණ/වෙළෙඳ ලකුණ
    2. යුරෝ මුදල
    3. සාර්ක් සංවිධානය (SAARC)
    4. ලෝක බැංකුව

48. 1. පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා
    2. පිරිවැය
    3. පහසුව
    4. සන්නිවේදනය

49. 1. ආදානය/යෙදවුම්
    2. සැකසීම/ක්‍රියාවලිය
    3. ප්‍රතිදානය/නිමැවුම
    4. ගබඩා කිරීම

50. 1. අවශ්‍ය අරමුදල් ප්‍රමාණය නිගමනයට හා සම්පාදනයට
    2. අරමුදල් ආයෝජන තීරණයට
    3. අරමුදල් ඌණතාවයක් හඳුනාගෙන පිළියම් යෙදීමට
    4. අතිරික්ත අරමුදල් ඵලදායී ව යෙදීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, අගෝස්තු 2016
General Certificate of Education (Adv.Level) Examination, August 2016

# ව්‍යාපාර අධ්‍යයනය - පිළිතුරු - II

## II - I කොටස

01. (i) (අ) i. නිෂ්පාදන (මෙහෙයුම්)
ii. මූල්‍ය/ ගිණුම්
iii. අලෙවිකරණ
iv. පරිපාලන
v. මානව සම්පත්
vi. පර්යේෂණ හා සංවර්ධන
vii. කළමනාකරණ හා තොරතුරු පද්ධති

(කරුණු 04ට ලකුණු 02)

(ආ) <u>ගනුදෙනුකරුවන්</u>

අවස්ථා :

i. ගනුදෙනුකරුවන් සංඛ්‍යාව වැඩි වීම
ii. ගනුදෙනුකරුවන්ගේ වැය කළ හැකි ආදායම ඉහළ යාම
iii. ගනුදෙනුකරුවන්ගේ ජීවන රටාවේ වෙනස් වීම
iv. ගනුදෙනුකරුවන්ගේ සංවිධාන ශක්තිය අඩු වීම
v. භාණ්ඩ අතර විතැන්වීමේ වියදම වැඩි වීම
vi. ගනුදෙනුකරුවන්ගේ භාණ්ඩ හා වෙළෙඳ පොළ පිළිබඳ දැනුවත් භාවය අඩු වීම

(කරුණු එකකට ලකුණු 1/2)

තර්ජන :

i. ගනුදෙනුකරුවන් සංඛ්‍යාව අඩු වීම
ii. ගනුදෙනුකරුවන්ගේ වැය කළ හැකි ආදායම පහළ යාම
iii. සීමිත ගනුදෙනුකරුවන් සංඛ්‍යාවක් විසින් වැඩිපුර ප්‍රමාණයක් මිල දී ගැනීම
iv. ගනුදෙනුකරුවන්ගේ සංවිධාන ශක්තිය වැඩි වීම
v. භාණ්ඩ අතර විතැන්වීමේ වියදම අඩු වීම
vi. ගනුදෙනුකරුවන්ගේ භාණ්ඩ හා වෙළෙඳ පොළ පිළිබඳ දැනුවත් භාවය වැඩි වීම

(කරුණු එකකට ලකුණු 1/2)

<u>තරගකරුවන්</u>

අවස්ථා :

i. තරගකරුවන්ගේ මූල්‍ය ශක්තිය අඩු වීම
ii. තරගකරුවන්ගේ අලෙවි උපක්‍රම දුර්වල වීම
iii. තරගකරුවන් වෙළෙඳ පොළෙන් ඉවත් වීම
iv. තරගකරුවන් පාරිභෝගිකයන් වෙනුවෙන් සපයන පහසුකම් හා සේවා අඩු වීම

(කරුණු එකකට ලකුණු 1/2)

තර්ජන :

i. තරගකරුවන් අතර තරගකාරීත්වය ඉහළ යාම (සමාන මූල්‍ය ශක්තිය, අලෙවි උපක්‍රම වර්ධනය වීම ආදී)
ii. තරගකරුවන් ගනුදෙනුකරුවන්ට වැඩි පහසුකම් හා සේවා සැපයීම
iii. ආදේශක භාණ්ඩ වැඩි සංඛ්‍යාවක් වෙළෙඳ පොළට පැමිණීම /තරගකරුවන් වැඩි සංඛ්‍යාවක් වෙළෙඳ පොළට පැමිණීම
iv. වෙළෙඳ පොළෙන් ඉවත් වීමට බාධා තිබීම

(කරුණු එකකට ලකුණු 1/2)

(ii) (අ) බැංකුවට :

i. පාඩු සිදු වීම
ii. බැංකුවේ මූල්‍ය ශක්තිය අඩු වීම/ ණය දීමේ හැකියාව අඩු වීම
iii. ණය එකතු කරගැනීමට අමතර පිරිවැයක් දැරිය යුතු වීම
iv. බැංකුවේ ප්‍රතිරූපය බිඳ වැටීම

(එක කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 02කට ලකුණු 01)

ව්‍යාපාරිකයාට :

i. විශ්වාසය පලුදු වීම
ii. ව්‍යාපාරික ප්‍රතිරූපය බිඳ වැටීම
iii. ව්‍යාපාරයට අනාගතයේ දී ණය මුදල් ලබාගැනීමට අපහසු වීම
iv. ඇප සුරකුම් අහිමි වීම
v. විවිධ නඩු හා අලාභවලට මුහුණදීමට සිදු වීම
vi. ආයතනය පැවැත්ම අස්ථාවර වීම

(එක් කරුණකට ලකුණු 01)

(ආ) ශක්තීන් :

i. පක්ෂපාතී සේවකයන් බිහි වීම
ii. ආයතනය තුළ සාමූහිකත්වය ඇති වීම
iii. සමාජ අනන්‍යතාවයක් ඇති වීම
iv. සේවකයන්ගේ හැසිරීම ආයතනයේ සංස්කෘතියට අනුකූල වීම

(එක් කරුණකට ලකුණු 01)

දුර්වලතා :

i. සේවක-සේව්‍ය මත ගැටුම් ඇති වීම
ii. පුද්ගල සිතීම් හා හැසිරීම් සංස්කෘතික රාමුවට කොටු වීම
iii. උප සංස්කෘතීන් බිහිවීමට ඉඩ තිබීම
iv. සංස්කෘතියේ නොගැළපීම් නිසා සේවක කාර්ය සාධන විවිධත්වයන් ඇති විය හැක.

(එක් කරුණකට ලකුණු 01)

(iii) (අ) ස්වාභාවික පරිසරය - සමාජයීය හා සංස්කෘතික පරිසරය

නාගරික ප්‍රදේශවල අධික උෂ්ණාධික කාලගුණයක් පවතින බැවින් ස්වාභාවික වෘක්ෂලතා/මල් ආදියට කාර්යාලවල ඉල්ලුමක් නිර්මාණය වී ඇත. එනම්, ස්වාභාවික පරිසරය මිල දී ගැනීමේ සංස්කෘතියක් නිර්මාණය වී ඇත.

(ලකුණු 02 යි)

(උදාහරණ නැත්නම් ලකුණු 01 යි)

(ආ) දේශපාලන පරිසරය - ආර්ථික පරිසරය

රජය විසින් භාණ්ඩ හා සේවා මත VAT අය කළ හොත් භාණ්ඩ හා සේවා මිල ඉහළ යන අතර එය පාරිභෝගික ක්‍රය ශක්තිය කෙරෙහි බලපෑම් ඇති කරයි. VAT ප්‍රමාණය අඩු කළ හොත් පාරිභෝගික ක්‍රය ශක්තිය කෙරෙහි හිතකර ලෙස බලපායි.

(ලකුණු 02 යි)

(උදාහරණ නැත්නම් ලකුණු 01 යි)

(iv) (අ) 1. වැඩ බෙදීම හා කාර්යයන් පැවරීමේ දී
2. උසස් වීම් ලබාදීමේ දී හා මාරු කිරීමේ දී
3. වැටුප්තල සකස් කිරීමේ දී
4. පුහුණුව හා සංවර්ධනයට තෝරා ගැනීමේ දී
5. කාර්යඵල ඇගයීමේ දී
6. සේවකයින් ස්ථිර කිරීමේ දී හා ඉවත් කිරීමේ දී
7. සේවක සුබසාධන කටයුතුවල දී

(එක කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02ට ලකුණු 02 යි)

(ආ) මගියා :
1. නියමිත මුදල ගෙවා ප්‍රවේශ පත්‍රයක් ලබාගැනීම
2. බසය තුළ විනීත ව හැසිරීම
3. පූජ්‍ය පක්ෂයට, ආබාධිත, ගර්භිණී මාතාවන්ට, වැඩිහිටියන්ට උදව් කිරීම හා ආසන පිරිනැමීම
4. බස් රථයට හානි නොකිරීම

(එක කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 02ට ලකුණු 01 යි.)

කොන්දොස්තර මහතා :
1. විනීත ව කථා කිරීම
2. නියමිත පරිදි ඉතිරි මුදල් ගෙවීම
3. අවශ්‍ය අයට උදව් කිරීම
4. බස්රථය පිරිසුදු ව පවත්වාගෙන යාම

(එක කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 02ට ලකුණු 01 යි.)

(v) 1. අඛණ්ඩ ව පැවති අයහපත් කාලගුණය /අධික වර්ෂාපතනය හා නියගය තේ නිෂ්පාදනය අඩාල වීමට හේතු විය.
2. තේ නිෂ්පාදනයට යොමු වී සිට සේවකයින් හා ආයෝජකයන් කර්මාන්තයෙන් ඉවත් වීම/තේ සඳහා ඇති ජාත්‍යන්තර මිල ගණන් පහළ යාම නිසා ඇතැම් කර්මාන්තකරුවන් ඉන් ඉවත් වී ඇත.
3. තේ වෙනුවට ආදේශක බිහිවීම නිසා තේ ඉල්ලුම අඩු වීම
4. සමහර රටවලට බලපෑ විවිධ හේතු නිසා විදේශ රටවලින් තේ සඳහා ඇති ඉල්ලුම අඩු වීම. මැද පෙරදිග රටවල ඇති වූ යුදමය තත්වය
5. තේ කර්මාන්තකරුවන්ගේ මූල්‍ය හා වෙනත් අර්බුද
6. නිෂ්පාදන පිරිවැය වැඩි වීම
7. ඵලදාව අඩු වීම

(පැහැදිලි කිරීම් සහිත හේතු 02කට ලකුණු 04)

02. (i) (අ) 1. භාණ්ඩ හා සේවා මිල වැඩි වීම නිසා ඉල්ලුම අඩු වීම/අය කරන බදු නිසා එය භාණ්ඩයේ මිලට එකතු වී මිල වැඩි වීමෙන් ඉල්ලුම අඩු වේ.
2. යෙදවුම් මිල ඉහළ යාම නිසා නිෂ්පාදන පිරිවැය ඉහළ යාම / භාණ්ඩ හා සේවා මත බදු අය කිරීමෙන් නිෂ්පාදන පිරිවැය වැඩි වීම
3. විකුණුම් ආදායම අඩු වීම නිසා ලාභ අඩු වීම/ භාණ්ඩ මිල වැඩි වීමෙන් ඉල්ලුම අඩු වී විකුණුම් ආදායම අඩු වන අතර ලාභය ද අඩු වේ.
4. ප්‍රතිආයෝජනය අඩු වීම
5. බදු පැනවීම නිසා සමහර කර්මාන්ත ආරක්ෂා වීම
6. යටිතල පහසුකම් වර්ධනය කිරීමට හැකි වීම

(එක් පැහැදිලි කිරීමට ලකුණු 1/2 බැගින් කරුණු 04කට ලකුණු 02)

(ආ) 1. මුදල් සැපයුම් පාලනය කිරීම/ ණය සීමා පැනවීම තුළින් මූල්‍ය ආයතනවලට ණය ලබාදීමේ හැකියාව අඩු වන අතර මේ නිසා මුදල් සැපයුම පාලනය වේ.
2. උද්ධමනය පාලනය කිරීම/මේ නිසා රට තුළ සංසරණය වන මුදල් ප්‍රමාණය අඩු වීමෙන් පාරිභෝගික ක්‍රය ශක්තිය අඩු වී ඉල්ලුම පාලනය වන අතර එය උද්ධමනය අඩු වීමට බලපායි.
3. තෝරාගත් ක්ෂේත්‍රවල ආයෝජනය ධෛර්යමත් කිරීම හෝ අධෛර්යමත් කිරීම/සංචාරක ක්ෂේත්‍රය ධෛර්යමත් කළ යුතු නම් ණය සැපයුම වැඩි කරන අතර මෝටර් රථ ආනයනය අධෛර්යමත් කළ යුතු නම් ණය සැපයුම පාලනය කරයි.
4. බැංකු කටයුතු පාලනය කිරීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු දෙකකට ලකුණු 01)
(පැහැදිලි කිරීමකට ලකුණු 1/2 බැගින් දෙකකට ලකුණු 01)
(ලකුණු 04)

(ii) (අ) 1. සේවක ආකර්ෂණය පහසු වීම/පාරිභෝගික අයිතින් තහවුරු කරන ව්‍යාපාරවල පැවැත්ම ස්ථාවර වන නිසා සේවක ආකර්ෂණය පහසු වේ.
2. විකුණුම් ඉහළ යාම/පාරිභෝගික ඉල්ලුම වැඩි වීමෙන් විකුණුම වැඩි වේ.
3. ලාභය වැඩි වීම/විකුණුම් වැඩි වීමෙන් ඒකක පිරිවැය අඩු වී ලාභය වැඩි වේ.
4. ව්‍යාපාරයේ කීර්තිනාමය හා ප්‍රතිරූපය ඉහළ යාම
5. පාරිභෝගික පැමිණිලි අඩු වීම/මෙවැනි ආයතනවලට ඇති චෝදනා අඩු වෙයි.
6. ප්‍රමිතිගත නිෂ්පාදන නිසා නාස්තිය සහ අපතේ යාම් අඩු වීම/ ප්‍රමිතියට අනුව භාණ්ඩ නිපදවන විට අනවශ්‍ය සම්පත් යොදා නොගනී/මේ නිසා නාස්තිය හා අපතේ යාම අඩු වේ.

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 02ට ලකුණු 01)
(පැහැදිලි කිරීමකට ලකුණු 1/2 බැගින් 02ට ලකුණු 01)

(ආ) ව්‍යාපාර නාම අඥා පනත යටතේ (1918 අංක 06) අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කළ යුතු ය.
(ඉරි ඇඳි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02ට ලකුණු 02 යි.)
(ලකුණු 04)

(iii) (අ) 1. තනි ව්‍යාපාරයකට වඩා පහසුවෙන් ආරම්භ කළ හැකි වීම
2. ස්වාධීන ව තීරණ ගත හැකි වීම
3. ලාභය තනි ව භුක්ති විඳිය හැකි වීම
4. ව්‍යාපාරයේ රහස්‍ය භාවය ආරක්ෂා කරගත හැකි වීම
5. සිය කැපවීම හා පූර්ණ පරිශ්‍රමය මත ව්‍යාපාරය දියුණු කරගත හැකි වීම

6. ගනුදෙනුකරුවන් හා ව්‍යාපාරය අතර දැඩි සම්බන්ධතාවක් ඇති කරගත හැකි වීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකකට ලකුණු 02)

(ආ) 1. කොටස්කරුවන් සීමා වීම නිසා වැඩි ප්‍රාග්ධනයක් රැස් කරගත නොහැකි වීම

2. ණය ප්‍රාග්ධනය සම්පාදනය සීමා වීම

3. අතිරේක ප්‍රාග්ධනය සපයා ගැනීම සඳහා කොටස් ප්‍රසිද්ධියේ අලෙවි කළ නොහැක.

4. නීතිමය වශයෙන් පාලනයේ ඇති සීමා සහිත බව නිසා වංචා ඇති වීමට ඉඩකඩ වැඩි වීම

(එක් අවාසියකට ලකුණු 01 බැගින් දෙකකට ලකුණු 02)
(ලකුණු 04)

(iv) 1. සාමාජික ප්‍රතිලාභ වැඩි කිරීම/දැනට සමූපකාර සමිති සාමාජිකයන්ට ප්‍රතිලාභ ලබාදීම ප්‍රායෝගික ව සිදු නොවන නිසා ප්‍රතිලාභ වැඩි කිරීම මඟින් ජනතාව අතර එය ජනප්‍රිය කළ හැක.

2. සමූපකාර ව්‍යාපාරයට සාමාජිකයින් වශයෙන් තරුණ ප්‍රජාව බඳවා ගැනීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කිරීම./සමූපකාර සමිති වලට බොහෝ විට සම්බන්ධ වන්නේ ප්‍රාදේශිය දේශපාලඥයන් ය. තරුණ ප්‍රජාව මීට සම්බන්ධ කරගැනීමෙන් මෙය වඩාත් ජනප්‍රිය කළ හැක.

3. ප්‍රජාව දැනුවත් කිරීම/විවිධ වැඩමුළු තුළින් ප්‍රජාව දැනුවත් කළ හැකි ය.

4. විවිධ ව්‍යාපාර ක්ෂේත්‍රවලට යොමු වීම/ප්‍රවාහන, විශ්වවිද්‍යාල, ආරෝග්‍යශාලා, ආපණ ශාලා, සිනමාහල්, අධ්‍යාපන, මුද්‍රණ ආදි ක්ෂේත්‍රවල සමූපකාර සමිති ප්‍රචලිත කළ හැක.

5. නව අලෙවි ප්‍රවර්ධන ක්‍රම භාවිත කිරීම

6. වැඩි කාලයක් විවෘත ව තැබීම

7. නව තාක්ෂණය යොදාගැනීම

8. සේවකයන් හා කළමනාකරුවන් පුහුණුව හා සංවර්ධනය

9. සේවක දිරිගැන්වීම් ක්‍රම වර්ධනය

(එක් යෝජනාවකට ලකුණු 1/2 බැගින් 04කට ලකුණු 02 යි.)
(පැහැදිලි කිරීමකට ලකුණු 1/2 බැගින් පැහැදිලි කිරීම් 04ට ලකුණු 02යි.)

(v) ව්‍යවසායකත්වය නිසා ව්‍යාපාර ආරම්භ වේ. එමඟින් නව රැකියා අවස්ථා බිහි වේ. එමෙන් ම නවෝත්පාදන බිහි වීම තුළින් නව ව්‍යාපාර අවස්ථා ඇති වේ. නව භාණ්ඩ වෙළඳ පොළට පිවිසීම නිසා දළ දේශීය නිෂ්පාදනය ඉහළ යන අතර ජනතාවගේ ජීවන තත්ත්වය ද උසස් වේ. වෙළඳ පොළ පුළුල් වීමත්, නව තරගකාරී වෙළෙඳ පොළවල් බිහිවීමත් සිදු වේ. ප්‍රාදේශීය සම්පත් භාවිතයට ගැනීමෙන් ඒවාට ඉහළ ඉල්ලුමක් ඇති වී ජනතාවගේ ආදායම ඉහළ යයි. මෙම කරුණුවල ප්‍රතිඵලයක් වශයෙන් ආර්ථික සංවර්ධනය ඇති වේ.

(උදාහරණ 04ක් දක්වමින් සම්පූර්ණ පැහැදිලි කිරීමකට ලකුණු 04යි.)

03. (i) (අ) 1. ආරම්භයේ දී ම වෙළඳ පොළක් සහිත වීම

2. ආරම්භයේ සිට ම ආදායම හා ලාභ ඉපයීමට හැකියාවක් පැවතීම

3. පුහුණු සේවකයින් සිටීම

4. දැඩි ප්‍රවර්ධන ප්‍රයත්නයක් දැරීමට සිදු නොවීම

5. පූර්ව ව්‍යාපාරයේ යහපත් ප්‍රතිරූපය හා කීර්තිනාමයෙන් ප්‍රයෝජන ගත හැකි වීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02ට ලකුණු 02 යි.)

(ආ) 1. ආත්ම විශ්වාසය/තමා පිළිබඳ තිබෙන ප්‍රබල විශ්වාසය යි. එනම්, අරමුණු සාර්ථක කරගත හැකි බවට තිබෙන ස්වයං විශ්වාසය යි.

2. කැපවීම/ තම අරමුණ ඉටු වන තෙක් මහන්සි නොබලා වැඩ කිරීමේ හැකියාව යි.

3. තරගකාරී බව/සාර්ථක ව්‍යවසායකයකු තරගකාරීත්වයට කැමැත්තක් දක්වයි. තරගකාරීත්වයට සාර්ථක ව මුහුණදෙයි.

4. නිර්මාණශීලී බව/ සාර්ථක ව්‍යවසායකයා නිතර අලුත් අදහසක් ඉදිරිපත් කරයි. එය නිර්මාණශීලීත්වය යි.

5. ගැටලු විසඳීමේ හැකියාව

6. බලපෑම් කිරීමේ හැකියාව

7. අධිෂ්ඨානශීලී බව

8. කුසලතා සහිත වීම

9. අභියෝග භාර ගැනීමේ හැකියාව

10. කාර්යක්ෂම නැඹුරුව

11. වෙනත් පිළිගත හැකි නිපුණතා

(කරුණු 04ක් නම් කිරීමට ලකුණු 01)
(කරුණු 04ක් නම් කර පැහැදිලි කිරීමට ලකුණු 01)
(ලකුණු 04)

(ii) 1. ව්‍යවසායකත්ව හැකියා අඩු වීම. ඇතැම් කුඩා ව්‍යාපාර නවෝත්පාදන බිහි නොකරයි. පවතින ව්‍යාපාරය ඒ අයුරින්ම පවත්වාගෙන යාමට උත්සාහ ගනී.

2. කළමනාකරණයේ දුර්වලතා සහිත වීම. නව කළමනාකරන ශිල්පීය ක්‍රම භාවිතා නොකරයි. දක්ෂ කළමනාකරුවන්ගේ උපදෙස් ලබා නොගනී.

3. මූල්‍ය දුෂ්කරතා පැවතීම. බොහෝ කුඩා ව්‍යාපාරවලට ඇත්තේ තමා සතු ප්‍රාග්ධනය යි. මූල්‍ය ආයතනවලින් ණය ලබා ගැනීමේදී ඇප සුරකුම් ඉදිරිපත් කිරීම ආදි ගැටළු නිසා මූල්‍ය පහසුකම් ලබාගැනීම දුෂ්කර වේ.

4. යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම

5. නව තාක්ෂණය යොදා නොගැනීම

6. මහා පරිමාණ ව්‍යාපාරවලින් එල්ල වන තරගයට මුහුණදිය නොහැකි වීම. මහා පරිමාණ ව්‍යාපාර තාක්ෂණය, මූල්‍යය, කළමනාකරණය, ප්‍රවර්ධන ක්‍රම, බෙදා හැරීම ආදියෙන් ශක්තිමත්ය. මේ නිසා ඔවුන්ගේ තරගයට මුහුණදීමට සුළු ව්‍යාපාරිකයන්ට අපහසුය.

7. අලෙවි කිරීමේ දී ඇති වන ගැටලු

8. පවුලේ සමාජිකයින් අතර ඇති වන මතභේද

(කරුණකට ලකුණු 1/2 බැගින් 04කට ලකුණු 02 යි.)

(පැහැදිලි කිරීමකට ලකුණු 1/2 බැගින් පැහැදිලි කිරීම 04ට ලකුණු 02 යි.)

(iii) (අ) 1) භාවිත කිරීමට අවබෝධයක් නොමැතිකම
2) අමතර පිරිවැයක් දැරීමට සිදු වීම
3) ගනුදෙනුව පිළිබඳ විශ්වාසය අඩු වීම
4) පාස්පොතේ ගනුදෙනුව සටහන් නොවීම
5) සාම්ප්‍රදායික ව කවුන්ටරයෙන් මුදල් ගැනීමට පුරුදු වී සිටීම
6) මිනිසුන් සමඟ ගනුදෙනු කිරීමට ඇති කැමැත්ත

(එක් හේතුවකට ලකුණු 01 බැගින් හේතු 02ට ලකුණු 02 යි.)

(ආ) 1) ණය සැපයීම මඟින්/ සුළු හා මධ්‍ය පරිමාණ නව සැපයීම තුළින් ව්‍යාපාරවල වර්ධනයට දායක වේ.
2) කුලීපිට ගැනුම් පහසුකම් සැපයීම මඟින්/එකවර මුදල් ගෙවා මිල දී ගත නොහැකි රූපවාහිනි, ශීතකරණ, ලැප්ටොප් ආදියට මූල්‍ය සමාගම කුලීපිට ක්‍රමයට මිල දී ගැනීමට පහසු ක්‍රම සපයන බැවින් ව්‍යාපාරික අලෙවිය වැඩි වේ.
3) කල්බදු මූල්‍යකරණය/දීර්ඝ කාලීන පාවිච්චිය සඳහා මිල දී ගන්නා මෝටර් රථ, යන්ත්‍ර ආදිය සඳහා මූල්‍ය සමාගම් බදු පහසුකම් සපයන බැවින් එවැනි ව්‍යාපාරවල ඉල්ලුම වැඩි වී ඇත.
4) තැන්පතු භාර ගැනීම. ඉල්ලුම් තැන්පතු හැර අනෙකුත් තැන්පතු බාරගනී.

(කරුණකට ලකුණු 1/2 බැගින් 02කට ලකුණු 01 යි.)

(පැහැදිලි කිරීමකට ලකුණු 1/2 බැගින් පැහැදිලි කිරීම 02ට ලකුණු 01යි.)

(ලකුණු 04)

(iv) (අ) 1) චෙක්පත් මඟින් ගනුදෙනු කළ හැකි වීම
2) ස්ථාවර නියෝග මත ගෙවීම් කළ හැකි වීම
3) ප්‍රේෂණ පහසුකම් ලබාගත හැකි වීම
4) අයිරා පහසුකම් ලබාගත හැකි වීම
5) බැංකු වාර්තා ලබාගත හැකි වීම
6) අනෙකුත් සේවා ලබාගැනීමේ දි ප්‍රමුඛතාවය හිමි වීම

(වාසියකට ලකුණු 1/2 බැගින් වාසි 02කට ලකුණු 01යි.)

(පැහැදිලි කිරීම 1කට ලකුණු 1/2 බැගින් 02කට ලකුණු 01යි.)

(ආ) 1) ඇණවුම් ලබාගැනීමට
2) ප්‍රවර්ධන කටයුතු කිරීමට
3) ගෙවීම් කටයුතු කිරීමට
4) තොරතුරු ලබාගැනීමට
5) පාරිභෝගිකයින් හා සේවකයින් සමඟ පණිවුඩ හුවමාරු කිරීමට
6) බැංකු ගනුදෙනු සිදු කිරීමට

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 04කට ලකුණු 02)

(ලකුණු 04)

v (අ) 1. බැංකු ගිණුමක් නොමැති වුව ද ණය කාඩ් පතක් භාවිත කිරීමෙන් භාණ්ඩ හෝ මුදල් ලබාගත හැකි වීම
2. ණය කාඩ්පත් හිමියන්ට භාණ්ඩ හා සේවා මිල දී ගැනීමේ දී වට්ටම් ලැබීම (මිල අඩු කිරීම)
3. නිශ්චිත කාලයක් සඳහා පොලී නොමැතිව භාණ්ඩ හා සේවා මිල දී ගත හැකි වීම

(එක් වාසියකට ලකුණු 01 බැගින් වාසි 02ට ලකුණු 02යි.)

(ආ) 1. ව්‍යාපාර අවදානම් ආවරණය කරන නිසා ව්‍යාපාරවල ආයෝජනයට යොමු වීම/විවිධ අවදානම් සඳහා රක්‍ෂණ ආවරණ හඳුන්වාදී ඇති නිසා ව්‍යාපාරකයෝ ආයෝජනයට යොමු වී ඇත.
2. ජාත්‍යන්තර වෙළඳාම වර්ධනයට හේතුවක් වීම/ආනයන/අපනයනය භාණ්ඩ සඳහා රක්‍ෂණාවරණ ලබාදී ඇති බැවින්, අපනයන ගෙවුම රක්‍ෂණය හඳුන්වා දී ඇති බැවින්ද ජාත්‍යන්තර වෙළඳාමට ව්‍යාපාරිකයන් පෙලඹී ඇත.
3. සේව්‍ය වගකීම් රක්ෂණය මඟින් සේවකයින්ට සිදු වන හානි ආවරණය කරගත හැකි වීම/ව්‍යාපාර ආයතනයන් සේවය කරන සේවකයන්ට සේවයේ යෙදී සිටිය දී සිදු වන හානි සඳහා රක්‍ෂකයා වන්දි ගෙවීමට බැඳී සිටී.
4. නිෂ්පාදිත වගකීම් රක්ෂණය මඟින් පාරිභෝගිකයින්ට සිදු විය හැකි හානි ආවරණය කරගත හැකි වීම

(එක් පැහැදිලි කිරීමකට ලකුණු 01 බැගින් 02ට ලකුණු 02යි.)

(මුළු ලකුණු 20)

04. (i) පක්ෂ ව :

1. භාණ්ඩ වැඩි ප්‍රමාණයක් ප්‍රවාහනය කරගත හැකි වීම/වැඩි මැදිරි සංඛ්‍යාවක් ඇති නිසා වැඩි භාණ්ඩ සංඛ්‍යාවක් ප්‍රවාහනය කළ හැක.
2. ප්‍රවාහනය සඳහා දැරිය යුතු පිරිවැය අඩු වීම/මහා මාර්ග ප්‍රවාහන ගාස්තුවලට වඩා දුම්රිය ප්‍රවාහන ගාස්තු අඩු වේ.
3. භාණ්ඩවල ස්වභාවය අනුව මැදිරි යොදාගත හැකි වීම/සතුන්, වෙනත් භාණ්ඩ සඳහා වෙන් වෙන් වූ මැදිරි තෝරාගත හැක.
4. නාස්තිය හා අපතේ යාම අඩු වීම
5. ඉක්මනින් භාණ්ඩ හා සේවකයින් ප්‍රවාහනය කළ හැකි වීම

(කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02ට ලකුණු 02 යි.)

විපක්ෂ ව :

1. ගමනාන්තය දක්වා යොදාගැනීමට නොහැකි නිසා වෙනත් ප්‍රවාහන ක්‍රමයක් යොදාගැනීමට සිදු වීමෙන් අමතර පිරිවැයක් දැරිය යුතු වීම/දුම්රියෙන් භාණ්ඩ ගොඩබැස්සවීමෙන් පසු ත්‍රිරෝද රථ, වැන්රථ වැනි ප්‍රවාහන ක්‍රමයක් ගමනාන්තය දක්වා යොදාගැනීම බොහෝ විට සිදු වේ.
2. අවශ්‍ය ඕනෑ ම වේලාවක භාවිත කළ නොහැකි වීම නිසා කලට වේලාවට භාණ්ඩ හා සේවකයින් ප්‍රවාහනය කළ නොහැකි වීම/කාලසටහනකට

අනුව ධාවනය කරන බැවින් අවශ්‍ය ඕනෑ ම විටක ප්‍රවාහනය කළ නොහැක.

3. දුම්රිය මාර්ගයෙහි සංඥා ඇණහිටීම ආදි කරුණු නිසා ප්‍රමාද වීම් ඇති වීමෙන් ව්‍යාපාර කටයුතු අඛණ්ඩ ව කරගෙන යාමේ දී බාධා ඇති වීම

(කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02 යි.)

(ii) (ආ) 1. සන්නිවේදනය සිදු කළ බවට සාක්ෂි නොමැති වීම
2. අංග චලනයන් වැරදියට වටහා ගැනීම
3. භාෂාමය ගැටලු ඇති වීම නිසා සඵලදායී ලෙස සන්නිවේදනය සිදු නොවීම
4. පුද්ගලයාගේ පෙනුම මත ආකල්පමය ගැටලු ඇති විය හැකි වීම
5. මුහුණට මුහුණ හමුවී සාකච්ඡා කිරීමේ දී හැඟීම් පාලනය කරගැනීමට නොහැකි වීමෙන් ගැටලු ඇති වීම (උදා : ආවේගාත්මක හැඟීම් ඇති වීම)
6. සූදානමක් නොමැති ව සන්නිවේදනය සිදු කිරීමේ දී විවිධ ගැටලු ඇති විය හැකි වීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 04කට ලකුණු 02 යි.)

(ආ) වාසි :

1. වේගවත් වීම
2. පිරිවැය අඩු වීම
3. එකවර විශාල පිරිසක් සමඟ ලිපි ගනුදෙනු කළ හැකි වීම
4. රූප, ශබ්ද, ප්‍රස්ථාර සහිත ව ලිපි ගනුදෙනු කළ හැකි වීම
5. රහස්‍යභාවය ආරක්ෂා වීම
6. පණිවුඩය ලද බව එවෙලේ ම දැනගත හැකි වීම
7. ගබඩා කළ හැකි වීම
8. ඕනෑ ම වෙලාවක ලිපි ගනුදෙනු කළ හැකි වීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 02ට ලකුණු 01 යි.)

අවාසි :

1. භාවිතය සඳහා තාක්ෂණික දැනුමක් අවශ්‍ය වීම
2. වෙනත් පාර්ශ්වයන්ට අයථා ක්‍රමවලින් කරුණු ලබාගැනීමට හැකි වීම නිසා ආරක්ෂාව පිළිබඳ ගැටලු ඇති වීම
3. තාක්ෂණික ගැටලු නිසා සන්නිවේදනයේ දී බාධා ඇති වීම
4. ලිපි ගනුදෙනු සිදු කරන දෙපාර්ශ්වයට ම අදාළ පහසුකම් තිබිය යුතු වීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 02ට ලකුණු 01 යි.)

(ලකුණු 04)

(iii) ගොවියා :

(අ) 1. වගාවේ දී අස්වැන්න නෙළීමේ දී, ගබඩා කිරීමේ දී, ප්‍රවාහනය කිරීමේ දී නිවැරදි ක්‍රම අනුගමනය නොකිරීම
2. ඵලදායිතාව අඩු වීම
3. යෙදවුම් පිරිවැය ඉහළ යාම
4. ගොවීන් අතර ඇති වන සංවිධානමය ශක්තිය හේතුවෙන් සැපයුම් පාලනය කිරීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 02ට ලකුණු 01 යි.)

වෙළෙන්දා :

1. අලාභය අවම කරගැනීමට හා ලාභය වැඩි කරගැනීමට ඉහළ මිල ගණන් නියම කිරීම
2. වෙළෙඳුන් අතර සංවිධාන ගත වීමෙන් සැපයුම පාලනය කිරීම
3. ප්‍රවාහනයේ දී හා ගබඩා කිරීමේ දී නිසි ක්‍රම භාවිත නොකිරීම නිසා නාස්තිය හා අපතේ යාම් වැඩි වීමෙන් මිල ඉහළ යෑම
4. අතරමැදියන් සංඛ්‍යාව ඉහළ යාම නිසා

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 02ට ලකුණු 01යි)

(ආ) 1. තීරු බදු බාධක/අධික ආනයන තීරු බදු නිසා ආනයන භාණ්ඩවල මිල ඉහළ යාම
2. රේගු නීතිරීති/ රේගු දෙපාර්තමේන්තුවේ දැඩි නීතිරීති නිසා ව්‍යාපාරයන්ට බාධක පැමිණ ඇත.
3. අපනයන සීමා කිරීම/අපනයන පංගු නියම කිරීම/අන්තර් ජාතික ගිවිසුම් යටතේ ඇතැම් අපනයනයකට භාණ්ඩ සඳහා වාර්ෂික ව අපනයනය කළ හැකි ප්‍රමාණයක් නියම වී ඇත්නම් එය අපනයන පංගු වේ. එය ජාත්‍යන්තර වෙළඳාමට පිවිසීමේ දී මුහුණපාන ගැටලුව යි.
4. ආනයන සීමා කිරීම/ආනයන පංගු නියම කිරීම
5. භාෂාමය හා සංස්කෘතිකමය ගැටලු
6. භාණ්ඩවල ගුණත්වය පිළිබඳ ගැටලු
7. ගැණුම්කරුවන් සොයාගැනීමේ ගැටලු
8. දැඩි තරගකාරීත්වය
9. වෙළෙඳ ගිවිසුම් මඟින් විවිධ බාධා ඇති වීම
10. විදේශ විනිමය අනුපාතය ඉහළ යාම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 04ට ලකුණු 02 යි.)

(ලකුණු 04)

(iv) වාසි

1. වෙළඳ පොළ පුළුල් වීම්/නිශ්චිත වෙළඳ පොළක් පැවතීම
2. අන්තර්ජාතික සහයෝගිතාවය වර්ධනය වීම
3. මිල උච්ඡාවචනයන්ට මුහුණදීම පහසු වීම
4. බදු සහන ලබාගත හැකි වීම
5. තීරු බදු සහන නිසා තරගකාරීත්වයට මුහුණදිය හැකි වීම

(වාසියකට ලකුණු 01 බැගින් වාසි 02කට ලකුණු 02 යි.)

ආවාසි

1. ගිවිසුමකට ඇතුළු වීම නිසා බාධා අවම වීමෙන් ව්‍යාපාරිකයන් අතර තරගකාරීත්වය ඉහළ යාම

7. අලෙවි කිරීමේ දී ඇති විය හැකි

2. ගිවිසුමෙහි නිතීරීතීවලට හා කොන්දෙසිවලට යටත් වීමට සිදු වීම
3. ගිවිසුමෙහි කොන්දේසි කඩවීමෙන් ගැටලු ඇති විය හැකි වීම

(අවාසියකට ලකුණු 01 බැගින් අවාසි 02කට ලකුණු 02 යි.)

(ලකුණු 04 යි.)

(v) (අ) 1. වෙළෙඳ පොළ පුළුල් වීම
2. ගනුදෙනුව වේගවත් වීම
3. ගනුදෙනුවට අදාළ ක්‍රියාකාරී පිරිවැය අවම වීම
4. පැය 24 පුරා ම ගනුදෙනු කළ හැකි වීම
5. විශාල ඉඩකඩක් අවශ්‍ය නොවීම
6. අතර මැදියන්ගෙන් තොර ව වෙළෙඳ කටයුතු කළ නොහැකි වීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02ට ලකුණු 02 යි.)

(ආ) 1. භාණ්ඩ භෞතික ව පරීක්ෂා කළ නොහැකි වීම
2. නියමිත භාණ්ඩය ම ලැබේ දැයි නිශ්චිත නොවීම
3. ගනුදෙනුවෙහි ආරක්ෂාව පිළිබඳ ගැටලු ඇති වීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02ට ලකුණු 02 යි.)

(මුළු ලකුණු 20 යි.)

## II කොටස

05. (i) (අ)

| භූමිකාව | කාර්යය හා උදාහරණ |
|---|---|
| අන්තර් පුද්ගල භූමිකා<br>• ප්‍රධානියා | නිතීමය උත්සවමය හෝ සමාජයීය කාර්යයන්හි දී සංවිධානයේ ප්‍රධානියා ලෙස පෙනී සිටීම<br>උදා : නව ශාඛාවන් විවෘත කිරීම<br>අමුත්තන් පිළිගැනීම<br>කොටස් හිමියන්ගේ රැස්වීම් ඇමතීම<br>ගිවිසුම් අත්සන් කිරීම |
| • නායකයා | සංවිධානමය අරමුණු ඉටු කරගැනීම සඳහා යටත් නිලධාරීන් දිරිමත් කිරීම හා අභිප්‍රේරණය කිරීම<br>උදා : සේවක කටයුතු අගය කිරීම<br>ගුණ දොස් දැකීම<br>සේවකයින් උසස් කිරීම්, මාරු කිරීම, ඉවත් කිරීම් |
| • සබඳතා පවත්වන්නා | තොරතුරු සපයන බාහිර පාර්ශ්ව හා සංවිධානය අතර සබඳතා පැවැත්වීම<br>උදා : ගනුදෙනුකරුවන්, සැපයුම් කරුවන්, වෙළෙඳ සංගම් හා ප්‍රාදේශීය ජනතාව සමඟ සබඳතා පැවැත්වීම |

(භූමිකාව නම් කිරීමට ලකුණු 1/2)
(කාර්යයන් 02ක් උදාහරණ රහිත ව සඳහන් කිරීමට ලකුණු 1/2 බැගින් ලකුණු 1)
(කාර්යයන් 02ම උදාහරණ සහිත ව පැහැදිලි කිරීමට ලකුණු 1 1/2 යි)

(ආ) 1. සම්පත් පැවතීම/ අවශ්‍ය ප්‍රමාණයත් සම්පත් පවතින්නේ නම් කළමනාකරණ තීරණ ක්‍රියාත්මක කිරීම පහසු වේ.
2. අවශ්‍ය දැනුම සහිත වීම/අවශ්‍ය දැනුම ඇති නිලධාරීන් හා සේවකයන් සිටීම තීරණ ක්‍රියාත්මක කිරීමට පහසුවකි.
3. සේවක සහයෝගය පැවතීම/ තීරණ ක්‍රියාත්මක කිරීමට යටත් සේවකයන්ගේ සහාය අත්‍යවශ්‍ය වේ.
4. නිවැරදි නියාමනය හා පාලනය/තීරණ සාර්ථක ක්‍රියාත්මක වන්නේ ද යන්න නිතර නිතර සොයා බලා අඩුපාඩුවලට පිළියම් යෙදිය යුතු ය.
5. කාර්යයන් නියමිත පරිදි පැවරීම/ තීරණ ක්‍රියාත්මක කිරීමට නිවැරදි කාර්ය නිවැරදි පුද්ගලයන් වෙත පැවැරිය යුතු ය.
6. තීරණ පිළිබඳ සියලු පාර්ශ්වයන් දැනුවත් කිරීම

(එක් කරුණක් සඳහා ලකුණු 1/2 බැගින් කරුණු 02ට ලකුණු 01 යි.)
(පැහැදිලි කිරීමට ලකුණු 1/2 බැගින් 02ට ලකුණු 01 යි.)

(ලකුණු 04)

(ii) (අ) 1. රැකියාව නීරස වීම නිසා ඵලදායිතාව අඩු වීම/ එක ම කාර්ය දිගින් දිගට ම ඉටු කිරීමෙන් රැකියාව නීරස විය හැක.

2. වෘත්තීය ලෙඩ රෝග වැලඳීම/එක ම කාර්යයේ දිගින් දිගට ම නිරත වීමෙන් අක්ෂි දුර්වලතා හෘදය රෝග, දූවිලි ආසාත්මිකතා (නිදසුන ලෙස - ඇදුම), පිටේ කොන්දේ වේදනාව වැනි වෘත්තීමය රෝග ඇති විය හැක.

3. කුසලතාවන් සීමා වීම/එක ම කාර්යයේ නිරත වීමෙන් වෙනත් කුසලතා වර්ධනය කරගත නොහැකි අතර කුසලතාව එම කාර්යයට පමණක් සීමා වේ.

4. රැකියාව අහිමි වුව හොත් වෙනත් රැකියාවක් සොයාගැනීම අපහසු වීම

(එක් අවාසියකට ලකුණු 01 බැගින් අවාසි 02ට ලකුණු 02 යි.)

(අ) 1. සංවිධානයේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කරගැනීම සඳහා සැමගේ දායකත්වය ලබා ගැනීමට

2. ඉහළ කාර්ය සාධනය සඳහා සේවකයන් අභිප්‍රේරණයට

3. විවිධ අංශ අතර සිටින සේවකයන්ගේ කටයුතු සමායෝජනයට හා මගපෙන්වීමට

4. සංවිධානයේ විවිධ අංශ සමග සන්නිවේදනය පවත්වා ගැනීමට

5. සංවිධානයේ කටයුතු පාලනයට

6. සහකරුවන්ගේ ආත්ම විශ්වාසය හා මානසික ශක්තිය තහවුරු කිරීමට

(ඉහත හේතු 02ක් දක්වමින් කරන පැහැදිලි කිරීමකට ලකුණු 02 යි.)

(ලකුණු 04)

(iii) (අ) 1. යන්ත්‍ර අලුත්වැඩියා කිරීම/ දෝෂ සහිත යන්ත්‍ර අලුත්වැඩියා කිරීම යි.

2. අවසාන නිෂ්පාදිතය පරීක්ෂා කිරීම/නියමිත ප්‍රමිතියට අන්දුයි පරීක්ෂා කිරීම හා එසේ නොවන්නේ නම් ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගැනීම යි.

3. සේවක පුහුණුව/සේවක පුහුණුව ප්‍රමාණවත් නොවන්නේ නම් සේවකයන්ට පුහුණුව ලබාදීම

4. අමුද්‍රව්‍ය වෙනස් කිරීම/දැනට යොදා ඇති අමුද්‍රව්‍යවලට වඩා හොඳ අමුද්‍රව්‍ය යෙදවීම

5. නිෂ්පාදන ක්‍රියාවලියේ අවශ්‍ය වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීම/නිෂ්පාදන ක්‍රියාවලිය යම් යම් දෝෂ ඇත්නම් අවශ්‍ය වෙනස්කම් කරමින් නිවැරදි කිරීම යි.

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02 කට ලකුණු 02 යි)

(ආ) 1. නිෂ්පාදිත ප්‍රමාණය

2. නිෂ්පාදිතයේ විවිධත්වය/නිෂ්පාදිතය

3. නිෂ්පාදන ක්‍රියාවලියේ නම්‍යශීලී බව

4. නිපදවීම සිදු කරන්නේ ඇණවුමකට අනුව ද? වෙළෙඳ පොළ සඳහා ද? ගබඩා කිරීම සඳහා ද? යන්න

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 04කට ලකුණු 02 යි.)

(ලකුණු 04)

(iv) (අ) 1. නිෂ්පාදිතයේ ගුණත්වය ඉහළ නැංවීම

2. නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩි කිරීම

3. නිෂ්පාදන පිරිවැය අඩු කිරීම

4. නව භාණ්ඩ හා සේවා හඳුන්වාදීම

5. නාස්තිය හා අපතේ යාම් අවම කිරීම

6. වඩාත් හොඳින් පාරිභෝගිකයා තෘප්තිමත් කළ හැකි වීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 04කට ලකුණු 02 යි.)

(ආ) 1. මහා පරිමාණ වාසි නිසා ඒකක පිරිවැය අඩු වීම

2. බොහෝ විට එක් පුද්ගලයෙකු මඟින් වුව ද නිෂ්පාදන ප්‍රවාහය පාලනය කළ හැකි වීම

3. සමස්ථ වෙළෙඳ පොළ පිළිබඳ අවධානය යොමු කිරීම

4. නවීන තාක්ෂණය පහසුවෙන් යොදාගත හැකි වීම

5. නියමිත කාලය අවසානයේ දී අර්ධ නිමි භාණ්ඩ නොමැති වීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02 යි.)

(ලකුණු 04)

(v) (අ) 1. අතිරික්ත තොග නොමැති වීම නිසා කාරක ප්‍රාග්ධන ගැටලු මතු නොවීම

2. තොග ඌණතා නොමැති වීමෙන් නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩ ව කරගෙන යාමට හැකි වීම

3. නාස්තිය හා අපතේ යාම අවම වීමෙන් පිරිවැය අවම කරගත හැකි වීම

4. ගබඩා වියදම්, ඇණවුම් වියදම්, ප්‍රවාහන වියදම් යන ආදිය අවම කරගත හැකි වීම

5. භාණ්ඩ සැපයුම නොකඩවා කරගෙන යා හැකි වීමෙන් පාරිභෝගිකයා තෘප්තිමත් කළ හැකි වීම

6. යන්ත්‍ර සූත්‍ර, ශ්‍රමය ආදි සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගත හැකි වීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02 යි.)

(ආ) 1. සේවක අභිප්‍රේරණය/දිරිගැන්වීම මඟින්

2. සේවක පුහුණු කිරීම මඟින්

3) නව තාක්ෂණ ක්‍රම යොදාගැනීම මඟින්

4) ගුණාත්මක අමුද්‍රව්‍ය යොදාගැනීම මඟින්

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02 යි.)

(මුළු ලකුණු 20)

06. (i) (අ) 1) සමාජයේ යහපැවැත්ම ආරක්ෂා වීම හා වැඩි දියුණු වීම

2) සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කිරීම හා මතු පරම්පරාවට සම්පත් ඉතිරි වීම

3) පරිසර හිතකාමී භාණ්ඩ නිෂ්පාදනය සිදු වීම

4) සමාජ ආරක්ෂාව ඇති වීම

5) සමාජයේ පොදු සමාජ අවශ්‍යතාවයන් පිළිබඳ ව සැලකිලිමත් වී නිෂ්පාදනය හා

6) සමාජයේ දිගු කාලීන පැවැත්ම පිළිබඳ අවධානය යොමු වීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02 යි.)

(ආ) 1. මාර්ග (බෙදා හැරීම)
2. ආවරණය
3. ප්‍රදේශ
4. මාර්ග මිශ්‍රය
5. ප්‍රවාහනය
6. තොග

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 02කට ලකුණු 01 යි.)
(පැහැදිලි කිරීමකට ලකුණු 1/2 බැගින් කරුණු 02කට ලකුණු 01 යි.)

(ලකුණු 04)

(ii) (අ) ගැනුම්කරු බලාපොරොත්තු වන ආකාරයට නිෂ්පාදිතයක් ඉදිරිපත් කිරීම අපේක්ෂිත නිෂ්පාදිතය යි.

උදා : ශුවන්විදුලියෙන් බලාපොරොත්තු වන අංග ගුණත්වය හා මෝස්තරය පිළිබඳ උදාහරණයක් මඟින් පැහැදිලි කළ යුතු ය.

(අපේක්ෂිත නිෂ්පාදිතය පැහැදිලි කිරීමට ලකුණු 1/2)
(උදාහරණ 03ක් දැක්වීමට එක් උදාහරණයකට ලකුණු 1/2 බැගින් 3ට ලකුණු 1 1/2 යි.)

(ආ) 1. නිෂ්පාදනය සම්බන්ධ තොරතුරු (නිෂ්පාදකයාට, රට, ලියාපදිංචි අංකය ආදිය)
2. භාණ්ඩ හෝ සන්නම
3. මිල
4. අඩංගු ද්‍රව්‍ය
5. නිෂ්පාදන දිනය
6. කල් ඉකුත් වීමේ දිනය
7. ගබඩා කිරීමට හා ප්‍රවාහනයට උපදෙස්
8. අනතුරු ඇඟවීම්/අවවාද
9. බර/පරිමාව

(එක් කරුණකට 1/2 බැගින් 04කට ලකුණු 02 යි.)
(ලකුණු 04)

(iii) (අ) 1. දැරිය යුතු පිරිවැය
2. භාණ්ඩයේ ස්වභාවය
3. වෙළෙඳ පොළේ ස්වභාවය
4. ඉල්ලුමේ ස්වභාවය
5. නිෂ්පාදකයාගේ ශක්තීන්
6. තරගකරුවන්ගේ බෙදා හැරීමේ මාර්ග
7. නීතිමය තත්ත්වයන්

(එක් කරුණකට 1/2 බැගින් 04කට ලකුණු 02 යි.)

(ආ) 1. සබන්වල ගුණත්වය, හැඩය, පෙනුම ආදිය වෙනස් කිරීම
2. තරගකාරී මිලක් නියම කිරීම
4. පහසුවෙන් මිල දී ගැනීමට අවස්ථාව සැලසීම

(එක් කරුණකට 1/2 බැගින් 04කට ලකුණු 02 යි.)
(ලකුණු 04 යි.)

(iv) (අ) 1. ව්‍යාපාර අයිතිකරුවන්ගේ ව්‍යාපාරය හා සබැඳි අගය (ධනය) උපරිම කිරීම
2. ලාභය උපරිම කිරීම
3. කොටසක ඉපයුම උපරිම කිරීම
4. මුදල් අව භාවිතය අවම කිරීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02ට ලකුණු 02 යි.)

(ආ) 1. පිරිවැය
2. කොන්දේසි
3. ආයතනයේ ස්වභාවය
4. ඇප සුරැකුම්
5. ණය මුදල ලබාගැනීමට ගතවන කාලය
6. ලබාගත හැකි ණය මුදල
7. ආයතනය සපයනු ලබන අනෙකුත් සේවාවන්
8. අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය
9. ආයතන සමඟ පවතින සම්බන්ධතාව

(එක් කරුණකට 1/2 බැගින් 04කට ලකුණු 02 යි.)
(ලකුණු 04)

(v)

| අදහස | ගත යුතු ක්‍රියාමාර්ගය |
|---|---|
| 01. විකුණුම් අඩු වීම/ තොග රැඳෙන කාලය වැඩි වීම | නව අලෙවි ප්‍රවර්ධන ක්‍රම භාවිත කර විකුණුම් වැඩි කර ගැනීම |
| 02. ණයගැතියන්ගෙන් මුදල් එකතු කරගැනීමට ගත වන කාලය වැඩි බව | මුදල් වට්ටම දීම, ණය එකතු කරගැනීමට සිටින සේවකයන් වැඩි කරගැනීම<br>සාධකකරණය |

(අදහසකට ලකුණු 01 බැගින් 02ට ලකුණු 02 යි.)
(ක්‍රියාමාර්ගකට ලකුණු 01 බැගින් 02ට ලකුණු 02 යි.)

(ලකුණු 04)
(මුළු ලකුණු 20)

07. (i) (අ) 1. භාණ්ඩය/ සේවාව සඳහා වූ ඉල්ලුම
2. ආයතනයේ පරමාර්ථ
3. නිෂ්පාදන ක්‍රම
4. අනාගත සේවක විශ්‍රාම යාම
5. සේවක පිරිවැටුම
6. සේවක උසස් වීම්
7. අනාගත ව්‍යාපෘති

(එක් කරුණකට 1/2 බැගින් 04කට ලකුණු 02 යි.)

(ආ) 1. පෞද්ගලික තොරතුරු (නම, වයස, උපන් දිනය ආදි)
2. අධ්‍යාපන සුදුසුකම්

3. වෘත්තීය සුදුසුකම්
4. විශේෂ කුසලතා
5. පළපුරුද්ද
6. සමාජ සම්බන්ධතාවන්ගේ ස්වභාවය
7. අනාගත බලාපොරොත්තු පිළිබඳ ව අදහසක්
8. අතීත සාර්ථකතාවයන්

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් 04කට ලකුණු 02 යි.)

(ලකුණු 04)

(ii)
1. අපේක්ෂකයාගේ කෘත්‍රිම හැසිරීම
2. අපේක්ෂකයාගේ චිත්ත වේගී ස්වභාවය නිසා සම්මුඛ පරීක්ෂණයට නිසි ලෙස මුහුණදිය නොහැකි වීම (අනියත බිය)
3. සන්නිවේදන දුර්වලතා (අපේක්ෂකයාගේ)
4. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ආකල්ප
5. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ පළපුරුද්ද අඩු බව
6. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් පූර්ව නිගමනවලට එළඹ තිබීම
7. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය අපේක්ෂකයාගේ බාහිර පෞරුෂත්වය පිළිබඳ ව සැලකිල්ලක් දැක්වීම
8. අයථා බලපෑම්

(එක් කරුණකට ලකුණු 01 බැගින් 04කට ලකුණු 04 යි.)

(iii) (අ)
1. සේවක ඵලදායිතාව ඉහළ යාම
2. සේවක අභිප්‍රේරණය ඇති වීම
3. සේවකයින්ට තම ශක්තීන් හා දුර්වලතා හඳුනාගත හැකි වීම
4. තම පුහුණු අවශ්‍යතා හඳුනාගත හැකි වීම
5. රැකියා ජීවන මාර්ග සැලසුම් කරගැනීමට පදනමක් ලැබීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් 02කට ලකුණු 02 යි.)

(ආ)
1. ආයතනයේ කළමනාකරණ තීරණවලට සහය ලබාදීම
2. සේවක ගැටලු කළමනාකරණ දැනුම්දීම හා ඒ පිළිබඳ සාකච්ඡා කිරීම
3. සේවක හෝ වෘත්තිමය ගැටලු විසඳීමට කළමනාකරණයට ඇති අපහසුතා හා බාධක පිළිබඳ සේවකයින් සමඟ සාකච්ඡා කිරීම
4. ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේදී කළමනාකරණයට සහය වීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් 02කට ලකුණු 02)

(ලකුණු 04)

(iv)
1. නිෂ්පාදන/මිල දී ගැනීම්
2. සේවක පැමිණීම/ වැටුප් වාර්තා සකස් කිරීම/ පුහුණුව හා සංවර්ධන
3. අලෙවි අංශය/දෙපාර්තමේන්තුව
4. අයවැය ලේඛන සැකසීම/මුදල් ගෙවීම/පොදු ලෙජරය

(එක් කරුණකට ලකුණු 01 බැගින් 04කට ලකුණු 04 යි.)

(v) (අ)
1. අදාළ බව
2. නිවැරදි බව
3. පූර්ණ බව
4. විශ්වාසදායි බව
5. සවිස්තරාත්මක බව
6. අවශ්‍ය වේලාවට ලබාගත හැකි වීම
7. අඩු පිරිවැය
8. විවිධ මාධ්‍ය ඔස්සේ ඉදිරිපත් කළ හැකි වීම

(එක් කරුණකට 1/2 බැගින් 04කට ලකුණු 02 යි.)

(ආ)
1. නිවැරදි තීරණ ගැනීමට හැකි වීම
2. කටයුතුවල වැරදි අවම වීම
3. ක්‍රියාවලිය කාර්යක්ෂම ව සිදු කරගත හැකි වීම
4. ක්‍රියාවලිය සඵලදායී ව සිදු කළ හැකි වීම
5. නිමැවුමේ ගුණාත්මක බව ඉහළ යාම
6. තොරතුරු ගබඩා කර පසුව ප්‍රයෝජනයට ගත හැකි වීම
7. පිරිවැය අවම වීම
8. සන්නිවේදන ක්‍රියාවලිය පහසු වීම
9. පාරිභෝගික සංඛ්‍යාව වැඩි කරගත හැකි වීම
10. අන්තර්ජාතික වෙළෙඳාමට පිවිසිය හැකි වීම

(එක් කරුණකට 1/2 බැගින් 04කට ලකුණු 02 යි.)

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

08. (i) (අ) විද්‍යුත් සම්මන්ත්‍රණ -

විවිධ ස්ථානවල සිටියත් මුහුණට මුහුණලා සියලු දෙනා ම සම්බන්ධ කරමින් විද්‍යුත් ජාල ඔස්සේ වීඩියෝ සාකච්ඡා පැවැත්වීම

(ආ) පාඨකථනය -

තම අදහස් ටයිප් කර අනෙක් පාර්ශ්වය වෙත යොමු කිරීම

(ඉ) හඬ කථනය -

මයික්‍රෆෝන භාවිත කරමින් වාචික අදහස් හුවමාරු කරගැනීම

(ඊ) වීඩියෝ කථනය -

වෙබ්කැමරා භාවිත කරමින් ශබ්දයට අමතර ව දර්ශන ද හුවමාරු කරගැනීම

(කරුණකට ලකුණු 01 බැගින් 04ට ලකුණු 04 යි.)

(ඉරි ඇඳි පද තිබීම අත්‍යවශ්‍ය යි.)